# බුදු සමය
# පුද්ගලයා හා සමාජය

(අභිනව සංස්කරණය)



කටුකුරුන්දේ ඤාණනන්ද හික්ෂු

## පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ

## විශේෂ නිවේදනය

2013.07.07 දින අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද 'පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය' මගින් පූජ්‍ය කටුකුරුන්දේ ඥාණානන්ද ස්වාමීන් වහන්සේ විසින් මේතාක් සම්පාදිත සහ ඉදිරියට සම්පාදනය කරනු ලබන සියලුම ධර්ම ග්‍රන්ථ ප්‍රකාශයට පත් කෙරෙන බවත් මින් පසු උන්වහන්සේගේ කිසිදු ග්‍රන්ථයක් කොළඹ ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය මගින් ප්‍රකාශයට පත් නොකරෙන බවත් අප පාඨක පිරිස වෙත මෙයින් දන්වා සිටිමු.

මෙයට<br>
සසුන් ලැදි<br>
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය

# බුදු සමය
# පුද්ගලයා හා සමාජය

## (අභිනව සංස්කරණය)


**කටුකුරුන්දේ ඤාණානන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම.



**ISBN: 978 - 955 - 1255 - 29 - 9**

ප්‍රකාශනය
ධර්මග්‍රන්ථ මුද්‍රණාගාරය
2011

# ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

**පොත ලබාගත හැකි ස්ථාන:**

1. අනුර රූපසිංහ මහතා - 27, කොළඹ වීදිය, මහනුවර.
2. ස්ටැන්ලි සූරියාරච්චි මහතා - 25, කඩවීදිය, දේවාලේගම.
3. ඩී. ටී. වේරගල මහතා - 422, වැලිපාර, තලවතුගොඩ.
4. හේමමාලා ජයසිංහ මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
5. සංජීව නවරත්න මහතා
   අංක 308/17 බී, කිරිවත්තුඩුව පාර, මාගම්මන, හෝමාගම.
6. හේමා රූපසිංහ මිය - 26, හැව්ලොක් පාර, ගාල්ල.
7. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මණ පාර, මාතර.
8. සිරිමා විජේරත්න මිය - ඇලපාත, රත්නපුර.
9. ඒ.ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   සමන්, ඇරැවුල හන්දිය, කණ්ඩලම පාර, දඹුල්ල.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ජේ.ඒ.ඩී. ජයමාන්න මහතා
    ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
12. ආර්.ඒ. චන්ද්‍රි රණසිංහ මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.

වෙබ් අඩවිය: www.seeingthroughthenet.net

මුද්‍රණය:
**කොලිටි ප්‍රින්ටර්ස්**
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 011-4 870 333

මහ මඟ පසෙකැ හළ
කැලි කසළ පිරි දිය වල
පියුමෙක් පිපෙද නිකසළ
සුවඳින් පුරන මන දොළ

එසෙයින්මැ ලොවැ අඳ
පුහුදුන් කසළ ගොඩ මැද
දිලෙයි සම්බුදු සව්වද
නැණො'ළි විහිදා හැමසඳ

-පුපඵ වගග, ධමමපද-

# පටුන


| | | |
|---|---|---|
| | | පිටු |
| හැදින්වීම | | v |
| ප්‍රකාශක නිවේදනය | | vi |
| ධර්ම ග්‍රන්ථ මුද්‍රණාභාරය මගින් පළකරන ග්‍රන්ථ මුද්‍රණයට දායක වීම | | viii |
| අමා ගහ | | ix |
| 01. | මව සහ දරුවා (පූර්විකාව) | 01 |
| 02. | සතර බ්‍රහ්ම විහරණය තුළින් දිස්වන බෞද්ධ සමාජ දර්ශනය | 03 |
| 03. | බෞද්ධ සමාජ දර්ශනයෙහි විශේෂ ලක්ෂණ | 11 |
| 04. | සතර සංග්‍රහ වස්තුව | 31 |
| 05. | ගැටපද විවරණය | 59 |

## හැඳින්වීම

බුදුසමය ඇසුරින් ගොඩනගා ගත හැකි සමාජ දර්ශනය කෙබඳු විය යුතුද යන්න මෙකල සමාජ විද්‍යාව හදාරන්නවුන්ගේ අවධානය යොමු වී ඇති වැදගත් ප්‍රශ්නයකි. මේ මාතෘකාවට අදාළව ගිහිකල අප අතින් ලියැවුන ශාස්ත්‍රීය ලිපි දෙකක් මේ කෘතිය තුළින් ඉදිරිපත් කැරෙයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කතානායක වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමන් මේ ලිපි දෙක පොතක් වශයෙන් පළකරන මෙන් අප වෙත ආරාධනා කර සිටියේ මෙයට සතළිස් වසරකට පමණ පෙර ලියැවුනද ඒවායේ කිසියම් කාලෝචිත බවක් දුටු නිසා විය හැකිය. පස්විසි වියේදී පමණ, එකල අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ප්‍රචලිතව පැවති " **සංස්කෘති"** සඟරාවට ශාස්ත්‍රීය ශෛලියකින් අප ලියූ මේ ලිපි තුළ ඇතැම් විට දුරවබෝධ පදද තිබිය හැක. එහෙත් වඩා සරල ශෛලියකින් නැවත සකස් කිරීමට තැත් කිරීමෙන් ඒවායේ 'පන්නරය' පලුදු විය හැකි බැවින්, ඒ වෙනුවට පොත අගට ගැටපද විවරණයක් යෙදුවෙමු. එසේම, මේ මාතෘකාවටම අදාළව මෑතකදී සරල බසින් ලියැවුන **"මව සහ දරුවා"** (හිතක මහිම-I හි 4-5 පිටු) රචනය පොතට 'පූර්විකාවක්' වශයෙන් ඇතුළත් කළෙමු. අපගේ නිවනේ නිවීම දෙසුම් හා පහන් කණුව දෙසුම් කියවන සැදැහැවතුන්ට පමණක් නොව සාමාන්‍යයෙන් බණ දෙසුම් ගැන උපේක්ෂාවන විද්වතුන්ටද මේ කෘතිය ප්‍රයෝජනවත් වෙතියි හඟිමු.

පරලෝසැපත් සිය දයාබර දෙමවුපියන්ට පින් පිණිස කතානායකතුමන් මෙම ප්‍රථම මුද්‍රණයෙහි පිටපත් 2000 ක බරපැන දැරූ බැවින් ධර්මදානමය කුශලය ඔවුන් සැමටම පරම ශාන්ත උතුම් නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවායි පතමු.

මෙයට, සසුන්ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු**

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව', කන්දේගෙදර, දේවාලේගම
(2552) 2008 දෙසැම්බර්

---

## බුදු සමය පුද්ගලයා හා සමාජය
### (අභිනව සංස්කරණය)

ධර්මයෙහි දැක්වෙන 'සතර සංග්‍රහ වස්තුව' බෞද්ධ සමාජ දර්ශනයෙහි අතිශයින් වැදගත් අංශයක් හෙළිකරන්නකි. ඒ මාතෘකාවට අදාළව අප විසින් පවත්වන්නට යෙදුන 140 වෙනි පහන් කණුව දෙසුම, පහන් කණුව ධර්ම දේශනා - 7 වෙළුමට ඇතුළත් වී ඇති නමුදු එය මෙම කෘතියෙහි විෂය ක්ෂේත්‍රයට අයත් බැවින්, එයද ඇතුළත් කොට අභිනව සංස්කරණයක් එළිදැක්වීම උචිතයැයි වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමන් කළ යෝජනාව අනුව මෙම අභිනව සංස්කරණය එළිදක්වමු.

**- සම්පාදක**
**(2555) 2011 අගෝස්තු**

# පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ

# ප්‍රකාශක නිවේදනය

දේවාලේගම, කන්දේගෙදර පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනවාසී පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීම උන්වහන්සේගේ අභිමතාර්ථයයි. ශ්‍රී දන්ත ධාතුන් වහන්සේ වැඩ වෙසෙන ඓතිහාසික මහනුවර පුරවරය කේන්ද්‍රකොටගෙන අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද **'පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය'** එම උදාරතර අරමුණ ඉටු කිරීමට ඇප කැපවී සිටියි.

මේතාක් කොළඹ කේන්ද්‍රකොටගෙන පවත්වා ගෙන යන ලද **'ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය'** තුළින් මින් ඉදිරියට උන්වහන්සේගේ ධර්ම ග්‍රන්ථ මුද්‍රණය නොකෙරෙන අතර එයට අදාළව පැවති ග්‍රන්ථ මුද්‍රණය හා බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, මේතාක් මහනුවර **'ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරය'** මගින් ඉටුකරන ලද ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ (seeingthroughthenet.net) වෙබ් අඩවිය පවත්වා ගෙන යාමත් මෙම **පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍ය භාරයේ** වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන්හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇති අතර ඒ පිළිබඳ සියලු විමසීම් පහත සඳහන් ලිපිනයට යොමු කිරීම මැනවි. ආධාර යොමු කිරීමට මෙම ගිණුම හැර සම්පත් බැංකුවේ **වෙනත් ගිණුමක් නොමැති බව** අප පාඨක පිරිස දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරමු.

මෙයට,<br>
සසුන් ලැදි<br>
**පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය**

**ආධාර මුදල් යොමු කිරීම:**
පොත්ගුල්ගල ධර්ම ග්‍රන්ථ ධර්ම ශ්‍රවණ මාධ්‍යභාරය
ගිණුම් අංක: 100761000202
සම්පත් බැංකුව - මහනුවර

**මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ විමසීම්:**

අනුර රූපසිංහ, 27, කොළඹ වීදිය, මහනුවර.
දුරකථන අංක: 0777-801938
ඊමේල් ලිපිනය: pothgulgala@seeingthroughthenet.net

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ ''උතුරට'' හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා ''එදා-වේල'' සඳහා වත් විය පැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මඟට නැමී ගත්හ. ලොවී - ලොවුතුරු මල් පල නෙලා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

''ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය'' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙල සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ ''උතුරට'' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. ''නිවනේ නිවීම'' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී ''පහන් කණුව ධර්මදේශනා'' පොත් පෙළෙහි ''බර පැන'' දැරීමටත්, දෙස් - විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත - පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. ''දෙන දේ පිරිසිදුවම දීමේ'' අදහසින් අමිල වූ දහම ඊට තිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම ''නැවත මුද්‍රණ'' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

''පොත් අලෙවිය'' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන ''දහම් පඬුර'' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහා ගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙදා-හදා ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් ''ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට'' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

''සබ්බදානං ධම්මදානං ජිනාති''

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම
2000 ජුනි 05 (2544 පොසොන්)

මෙයට,
සසුන් ලැදි
**කටුකුරුන්දේ ඤාණනන්ද හිඤ්ඤු**

# 01

# මව සහ දරුවා

## (පූර්විකාව)

දරුවකු බිහිවනු හා සමගම ලොවට මවක්ද බිහිවෙයි. දරුවා මාතෘත්වයේ සංකේතයයි. මවකගේ හද තුළ ජනිත වන දරු සෙනෙහස කොතරම් අසිරිමත් ද යත් එයින් රතු ලෙයක් සුදු **කිරක්** බවට පෙරළෙයි.

ලොව හැම සතුන් කෙරෙහිම පැතිර විය යුතු මෙත් ගුණයෙහි ආදර්ශ ඒකකය මවක තුළ දරුවා කෙරෙහි පහළ වන මෙත් සිතයි. බුදු පියාණෝද ඒ බව වදාළහ.;

**'යම් සේ මවක් තම එකම පුතු දිවි පුදා හෝ රැක ගනීද, එමෙන්ම හැම සතුන් කෙරෙහිම අපමණ වූ මෙත් සිතක් වඩනේය.'**

තමා බිහිකරන දරුවා සමග බිහිවන 'මව' තමා හදන - වඩන දරුවා සමග හැදෙනු - වැඩෙනු පෙනේ. ඒ හැදීම- වැඩීම, කරුණා, මුදිතා, උපේක්ෂා යන ඉතිරි බඹ විහරණ තුනෙනි.

දරුවකු හදන-වඩන මවකට, විටෙක සැර පරුෂ උපාය මාර්ග යොදා ගැනීමට සිදුවේ. දරුවා දඟකාර ළමා විය තුළින් හිතුවක්කාර නව යොවුන් වියට පිවිසෙන විට ඇගේ මුදු මොළොක් මෙත් සිත දැඩි ලෙසක් ගත් කුළුණු ගුණයකට පෙරළෙයි. එහෙත් ඒ හදෙහි තද බව නිසි මොහොත පැමිණි විට උණු වී යන්නේ **වෙඩරු** පිඩක් මෙනි.

දරුවා දැන් තුරුණු වියට පත්ව සිටියි. අනිකකුට අත නොපා

අදීනව ස්වශක්තියෙන් නැගිට සිටිය හැකි ඔහු දකින ඇතැමෙකු තුළ ඊර්ෂ්‍යාවක් පවා ඇතිවනු නොබැරිය, එනමුත් මව නම් තමා දරු වෙහෙසෙහි ප්‍රතිඵල ඔහු තුළින් දකිමින් මුදිතා ගුණයෙන් වැඩෙන්නීය. පුතු කෙරෙහි ඊර්ෂ්‍යා කිසිත් නැති ඇගේ සිත තුළ ඇත්තේ **දී කිරකට** බඳු පසන් බවකි.

ලොවට දරුවකු බිහිකොට හදා- වඩා දීමේ මව් කිස අවසන්ය. දන් පැමිණ ඇත්තේ දරුවා පිළිබඳව ඇති ඇලුම්-බැඳුම් අත හැරීමේ අවස්ථාවයි. එහෙත් එවැනි වෙන්වීමකට පවා අත්දැකීම් තුළින් මේරූ සිත් සතන් ඇති මව උපේක්ෂාවෙන් සූදානම්ව සිටින්නීය. පිරුණු **ගිතෙල්** කළයකට බඳු නොඉහිරෙන, නොකැලතෙන නොකැළඹෙන උපේක්ෂා ගුණයක් ඇය සතුව ඇත.

**මෛත්‍රීය, කරුණාව, මුදිතාව, උපේක්ෂාව** යන සතර බ්‍රහ්ම විහරණය, මව්වත් බවකින් දරුවකු තනන මවක් සීමිත අර්ථයකින් පුරුදු කරන බව පෙනේ. එබැවින් මේ ගුණධර්ම සතර, නිවෙසකට **කිරි, වෙඬරු, දීකිරි, ගිතෙල්** මෙන් සිතකට හුරු පුරුදු විය යුතුව ඇත. කෙසේ වෙතත් සිවු බඹ විහරණය යනු හදවතක් තුළ අසීමිත, අපරිමිත ලෙස මුදාහළ යුතු ගුණධර්ම පෙළකි. පුළුල්ව වඩා ගත් කල, සමාජ ක්ෂේත්‍රයට ආධ්‍යාත්මික ශක්තිය, සාමය, සමාදානය උදාකර දෙන මේ බඹ විහරණ සතරෙහි ප්‍රායෝගිකත්වයට හා ඒවා තුළ ඇති අන්‍යෝන්‍ය හිතකාමී ගුණයට මවක් සාක්ෂි දරන්නීය.

**-හිතක මහිම - 1 (4-5 පිටු)**

# 02

# සතර බ්‍රහ්ම විහරණය තුළින් දිස්වන බෞද්ධ සමාජ දර්ශනය

බුදුන්වහන්සේ තත්කාලීන සමාජයෙහි බ්‍රහ්මයා පිළිබඳව පැවති ඇතැම් අදහස් උදහස්, සමාජය තුළ ආචාර ධර්ම උද්දීපනය වන අයුරින් හැඩගැස්වූහ. වෛදික චින්තාවලියට අනුව ලොව මවා පාලනය කරන කේවල සනාතන බ්‍රහ්මයකු ඇති නමුදු බුදුසමයෙන් අනුමත කැරෙනුයේ අනිත්‍යතා ධර්මයට යටත් බ්‍රහ්මයින් හා බ්‍රහ්මලෝක සමූහයකි. බමුණන් විසින් බ්‍රහ්මයා ලෝකෝත්තරත්වයෙන් පුදනු ලැබූ මුත් බුදුසමය එවැනි මතයකට අනුබල නොදෙයි. එහෙත් ලෞකිකත්වය නොඉක්මැවූවන් අතර බ්‍රහ්මයෝ ශ්‍රේෂ්ඨයහ. ඔවුහු තපෝගුණයෙන් දෙවියන් පවා ඉක්මවති. බෞද්ධ සාහිත්‍යයෙහි හා කලා ශිල්පයන්හි බ්‍රහ්මයින් නිරූපිතව ඇත්තේ ද වැඩිහිටි ස්වරූපයකිනි.

බ්‍රහ්මසහව්‍යතාව ලැබීම බමුණන්ගේ උත්තරීතර ජීවන පරමාර්ථය විය. ඒ සඳහා ගත යුතු ප්‍රතිපදාව පිළිබඳව මතභේද බුද්ධකාලීන බ්‍රාහ්මණයන් අතර පැවති බවක් දීඝනිකායේ තෙවිජ්ජ සූත්‍රයෙන් හැඟේ. බ්‍රහ්මසහව්‍යතාවට පැමිණීමට ගත යුතු ඍජු නෛර්‍යාණික මාර්ගය කුමක් ද යන්න අරබයා වාසෙට්ඨ හා භාරද්වාජ යන බ්‍රාහ්මණ මාණවකයින් දෙදෙනා අතර විවාදයක් පැන නැඟුණි. විවාදය සමථයකට පත්කොට ගත නුහුණු ඔවුහු බුදුන්වහන්සේ වෙත එළඹුනහ. විවිධ බ්‍රාහ්මණ ආචාර්‍ය පරම්පරාවන් විසින් බ්‍රහ්මසහව්‍යතාව ලැබීමේ විවිධ මාර්ග දක්වන ලද හෙයින් ඒ සියලුම මාර්ග නෛර්‍යාණිකසේ සැලකිය හැකිදැයි ඔවුහු උන්වහන්සේගෙන් විමසූහ. අන්ධයින් වැලක් බඳුවූ බමුණු ඇදුරු

පරපුර අනුනට මහ හෙළිකොට දීමෙහි අසමත් බැව් වාසෙට්ඨ-භාරද්වාජ මාණවකයින් දෙදෙනාහට පෙන්වා දුන් බුදුන්වහන්සේ , බ්‍රහ්මසහව්‍යතාව ලැබ ගත හැකි නිවැරදි මාර්ගයක් දක්වා වදාළහ. එනම් **මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා** යන සතර බ්‍රහ්ම විහරණ යයි.

**සතර බ්‍රහ්ම විහරණය බෞඩ සමාජ දර්ශනයෙහි හරය කැටිකොට දක්වතැයි කිවහැක.** මෙම ආධ්‍යාත්මික ගුණාංග සතරෙහි එක්තරා ක්‍රමානුකූලත්වයක් දකිය හැක. සමාජගත පෘථග්ජන පුද්ගලයා සමාජ සේවය මගින් චිත්තපාරිශුඩියක් හා ඥාන පරිපාකයක් ලබමින් ක්‍රමික අධ්‍යාත්ම විකාශනයකට භාජනය වන අයුරු මේ ගුණාංග සතර විග්‍රහ කිරීමෙන් හෙළි වේ. සතර බ්‍රහ්මවිහරණය වූකලි මිනිසාහට මෙලොවදීම බ්‍රහ්මත්වය හිමිකොට දීමෙහි සමත් ශ්‍රේෂ්ඨ සමාජ ධර්ම සතරකි. එහෙයින් සිය දරුවන් අරමුණු කොට මේ සමාජ ධර්ම වඩනා දෙමව්පියෝ බෞඩ ව්‍යවහාරයට අනුව බ්‍රහ්මයින් ලෙස සළකනු ලැබෙත් [1]

මවක තුළ සිය ළ-දරුවා කෙරෙහි ඇති ස්නේහය මෛත්‍රියට ඇති අනගිතම නිදසුනයි. කිරිබවට පත් සිය රුධිරයෙන් ළදරුවා පෝෂණය කිරීම, දිවිපුදා හෝ ඔහු රැකගැනීම, මවක ගේ මෛත්‍රියෙහි ප්‍රධාන ලක්ෂණය.[2] ළදරුවා කෙරෙහි දැඩි ආසක්ත බවක්, මමායනයක්, ඇය තුළ ඇත. මෙම **මෛත්‍රිය** කරණ කොට ගෙන ඇයගේ හදෙහි මුදුමොළොක් ගුණය වැඩෙයි.

කෙමෙන් වැඩෙන ළදරුවා නොදනුවත් කමින් හෝ දඟයකින් හෝ බාහිර උවදුරකින් හෝ විපතට පත්වනු දකින මවක තුළ සංවේගයක සවරූපයෙන් කරුණාව හටගනී. බොළඳ දරුවකු කැටක් හෝ කැබිලිත්තක් මුවෙහිලාගත් කල ඔහුගේ හිස සිය වමතින් තරයේ අල්වා දකුණතෙහි ඇඟිල්ලකින් ඒ කැටය හෝ කැබිලිත්ත ලේ සහිතව ඇද දමන කල්හිද මවක තුළ ද්වේෂයෙන් තොර හුදු කරුණාධ්‍යාසයම බල පවත්වයි.[3] සිය අවවාද ඉක්මවා කළ

දහයකින් විපතට පත්වන දරුවාහට පවා ඇය හැඬූ කඳුලින් පිළියම් කරන්නීය. තම දරුවා විපතට පත් කල මව තුළ හටගන්නා **කරුණාව** ඇගේ හදෙහි උණුවන කම්පිත වන ස්වභාවයක් ඇති කරවයි. ඒ අනුව දයා, ක්ෂමා, දාක්ෂිණ්‍යාදී උදාර චෛතසිකයන් ගෙන් ඇගේ අධ්‍යාත්මයෙහි පවිත්‍රත්වය වැඩෙයි.

දරුවා යෙහෙන් හැදී-වැඩී සමාජයෙහි සවශක්තියෙන් නැඟී සිටිය හැකි තරුණයකු බවට පත්වෙයි. මවක තුළ **මුදිතාව** කුළුගැන්වෙනුයේ මේ අවසථාවෙහිය. ඇය මෛත්‍රී කරුණා ගුණ පෙරදැරි කොටගෙන දරු පරිශ්‍රමය දැන් පලදරා ඇත. එහෙයින් සිය පුත්‍රයා ගේ ශුභසිඞ්ය තමා ගේ ශුභසිඞ්යක් සේ සළකා තුටුවන්නීය. මුදිතා ගුණය කරණකොටගෙන හදෙහි ප්‍රසන්නතාව හා ප්‍රබෝධය වැඩෙයි.

මවගේ දීර්ඝ පරිශ්‍රමයෙහි අග්‍රඵලය මේ අයුරින් පුත්‍රයාහට මෙන්ම මවට ද හිමි වේ. ඇය ඇති දැඩි කළ ළදරුවා දැන් සවශක්තියෙන් නැඟී සිටිය හැකි අංගසම්පූර්ණ තරුණයෙකි. සිය ව්‍යායාමය සාර්ථක වනු දකීමෙන් හටගත් නිර්මල ප්‍රීතියක් ද ඇය භුක්ති විඳ ඇත. දරුවා පිළිබඳ වගකීම් භාරයෙන් මිදී ඇති හෙයින් දැන් ඇගේ ළය සැහැල්ලුය. එමෙන් ම දරුවා අරමුණු කොට පුරන ලද ගුණධර්ම භාරය හා ලබන ලද අත්දැකීම් නිසා ඇය අධ්‍යාත්ම ශක්තිය අතින් ගරුත්වයක් ලබා ඇත. හැඟීමෙන් හා බුඞියෙන් මුහුකුරා ගිය ඇය තුළ දැන් බලපවත්නේ **උපේක්ෂා** ගුණයයි. සිය දරුවා පිළිබඳ දැඩි ඇලුම් බැඳුම් දැන් ඇය හට නොමැත. එබැවින් සිය පුත්‍රයා ගේ යහපත තකා ඔහු ගෙන් වෙන්වීමට පවා ආත්මශක්තියක් ඇයහට ඇත. අනාසක්ත බව, මැදහත් බව, හදෙහි සැහැල්ලු බව, ගුණ දහම් හා අත්දැකීම් මඟින් ලබන දෘඪ ආත්මශක්තිය, ගරු කටයුතු බව, අකම්ප්‍ය බව හා උචිතානුචිත විවේක බුඞිය මෙම උපේක්ෂාවෙහි ලක්ෂණය.

සතර බ්‍රහ්මවිහරණය පාරාර්ථසේවයට කැප වූ පුද්ගලයා තුළ තිබිය යුතු නිවැරදි ජීවන දෘෂ්ටිය මෙන්ම ඔහුගේ ක්‍රමික අධ්‍යාත්ම විකාශනයද පිළිබිඹු කරයි. සමාජසේවකයා විසින් කළ යුත්තේ මවක් සිය දරුවා හට සීමා කොට වඩන ගුණාංග සතර අනුක්‍රමයෙන් ගමක, පෙදෙසක, රටක හා සමස්ත ලෝකයෙහිම වසන සත්ත්වයින් කෙරෙහි පතුරාලීමය. මව හා දරුවා අතර පවත්නා සම්බන්ධතාව පරාර්ථචර්යාවෙහි ආදර්ශ ඒකකය ලෙස ගිණිය හැක. එහි ම සාධාරණීකරණයෙන් සමාජ සේවකයාගේ ජීවන දෘෂ්ටිය හැඩගැසේ. සමාජ සේවයෙහි ලා මූලික අවශ්‍යතාව මුදු මොළොක් මෛත්‍රී ගුණයයි. සුහද, ලෙන්ගතු, බවකින් යුතුව සමාජ සේවකයා සමාජය සුඛිත මුදිත කිරීමෙහි නියැලෙයි. දෙවනුව අනුන්ගේ දුකෙහි දී ළය හුණු වන, කම්පා වන ස්වභාවය ඇති කරුණා ගුණය අත්‍යවශ්‍යය. ඒ අනුව හෙතෙම ධනයෙන් හා ශ්‍රමයෙන් අසරණයිනට සරණ වේ. සමාජ සේවකයකු ගේ ජීවන දෘෂ්ටිය මෛත්‍රියෙන් හා කරුණාවෙන් පමණක් ප්‍රභාවිත වුවහොත් පරාර්ථචර්යාව කරණකොටගෙන ඔහු තුළ එක්තරා අපූර්ව කුකුසක් ඇති විය හැක. සවකීය සමාජ සේවයෙහි ප්‍රතිඵලයක් වශයෙන් සුඛිත මුදිත වන පුද්ගලයකු දැක ඔහු තුළ ඊර්ෂ්‍යාපරවශ අසහනයක් හටගනු නොබැරිය. මමත්වයෙන් නිපන් අනියම් තෘප්තියක් සමාජ සේවයෙන් ලබන එබඳු සමාජ සේවකයා පීඩිත අසරණයින් සමාජය තුළ නිරතුරුවම සිටිනු දැකීමේ ගුප්ත ආශාවකින් මඩනා ලද්දෙකි. දුප්පතුන් නැති ලෝකයක් බිහි වීම ඔහුට රුචි නොවේ. මෙවැනි විපරීත මානසික සංඝට්ටනයක් සමාජ සේවකයකු තුළ ඇති නොවීමට නම් මුදිතා ගුණය අත්‍යවශ්‍යය. තම දරුවකු ස්වශක්තියෙන් නැඟී සිටිනු දක්නා මවක තුළ හටගන්නා මුදිතාව බඳු මුදිතා ගුණයක් සමාජ සේවකයා තුළද තිබිය යුතුවේ. **සමාජ සේවයෙහි පරමාර්ථය පුද්ගලයා දීනයකු බවට පත් කිරීම නොව ඔහු ගේ සහජ ශක්තිය මතුකොට දී ඔහු අදීනව ස්වශක්තියෙන් නැඟී සිටිය හැකි තත්ත්වයකට පත් කිරීමය.**

මුදිතාවෙනුදු සමාජ සේවකයා ගේ ජීවන දෘෂ්ටිය පරිසමාප්ත නොවේ. තම පරිශ්‍රමයෙන් අනිකකු සුවපත් වනු බලා ඔහු තුළ ඇති වන ප්‍රහර්ෂාත්මක මුදිතාවෙහි ද අතිධාවනය නුසුදුසුය. එයද දැඩි මමත්වයට තුඩු දෙන හෙයිනි. එහෙයින් අවංක සමාජ සේවකයා ඒ අන්තයට ද නොයෙයි. සමාජය වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් භාරයෙන් කොටසක් ගෙවී මෙන් ඔහු තුළ එක්තරා සැහැල්ලු බවක් හටගන්නා අතර සමාජ සේවයෙන් ලද සංකීර්ණ අත්දැකීම් භාරය හා ගුණධර්ම වගාව කරණකොටගෙන හේ අකම්ප්‍ය උපේක්ෂාවකින් විවේක බුද්ධියකින් හා ගරු ගාම්භීරයයකින් ද වැඩෙයි. තමාගෙන් පිහිට ලද පුද්ගලයා කෙරෙහි අනාසක්තව ඔහුගේ අභිවෘද්ධිය හා ස්වාධීනත්වය තකා ඔහු කෙරෙන් ඉවත් වීමට පවා අනුබල දෙන ආත්ම ශක්තියක් සමාජ සේවකයා වගාකර ගනී. **හේ මෛත්‍රියෙන් ළංවී කරුණාවෙන් පිහිට වී, මුදිතාවෙන් සතුටු වී, උපේක්ෂාවෙන් ඉවත් වී යයි.**

උපේක්ෂාව, පරාර්ථචර්යාවෙහි නියැලි පුද්ගලයාගේ පරිසමාප්තිය ලෙස ගතහොත් උපේක්ෂාවෙන් යුතු පුද්ගලයා තුළ මෛත්‍රිය, කරුණාව හා මුදිතාව අහෝසි වී දැයි කෙනකුට ඇසිය හැක. මුලින් ප්‍රබලව තුබූ බ්‍රහ්මවිහරණ තුනට කුමක් වී ද? මෙම ප්‍රශ්නයට පිළිතුරු ගිතෙලෙහි ගැබ්ව ඇත. ගිතෙල වනාහි දෙනුන් ගෙන් දොවාගත නොහැකි ද්‍රව්‍යයකි. දෙනුන්ගෙන් දොවා ගත හැක්කේ කිරි පමණි. උණුකිරීම්, කැළඹීම්, මිදවීම් ආදී ක්‍රියා සන්තතියක් හේතු කොට කිරි, දීකිරි, වෙඬරු යන අවසථා පසුකොට ගිතෙල හටගනී. එය වහා නොඉහිරෙන, නොකැළඹෙන, නොවැගිරෙන බර ද්‍රව්‍යයකි. එහෙත් පදමට සකස් වූ කිරෙහි සාරයත්, දීකිරෙහි සාරයත්, වෙඬරුවල සාරයත් ගිතෙලෙහි ගැබ්ව ඇත. **උපේක්ෂා සහගත පුද්ගලයා ද පිරුණු ගිතෙල් කළයක් වැන්න. ඔහුගේ මෛත්‍රිය කරුණාව හා මුදිතාව උපේක්ෂාවෙහි පරිසමාප්තියට ගොස් ඇත.** එකී මූලික ගුණයන් ගෙන් තොරව උපේක්ෂාව හට නොගනී. මේ නයින් බලන කල උපේක්ෂාව යනු ශූන්‍යත්වයක්

හෝ නිෂ්ක්‍රියත්වයක් හෝ නොවේ. එය නිරවද්‍ය ක්‍රියාශීලිත්වයට ඔබින ස්ථිරසාර පදනමකි. පරමාර්ථ සත්‍යාන්වේෂණයෙහිලා උපකාරී වන ධ්‍යාන අංගයක් ලෙස ගත් කල චතුර්ථධ්‍යාන අවස්ථාවෙහි පරිසමාප්තියට යන උපේක්ෂාව ඥාන දර්ශනය සඳහා උපයෝගී කරගත හැකි එකඟ වූ, පිරිසිදු වූ, මෘදු වූ කර්මණ්‍ය වූ අකම්ප්‍ය වූ සිතක් යොගාවචරයා හට ගෙන දෙයි.[5] පරාර්ථ සේවයට කැප වී මෛත්‍රිය, කරුණාව හා මුදිතාව ඔස්සේ වගා කැර ගන්නා උපේක්ෂාව ද එම පරාර්ථ සේවයෙහි ලා මහෝපකාරී යන එකඟ, පිරිසිදු, මෘදු, කර්මණ්‍ය, අකම්ප්‍ය සිතක් සමාජ සේවකයා හට හිමිකැර දෙයි. පරාර්ථ සේවයෙන් ලත් අත් දැකීම් නිසා මුහුකුරා ගිය නුවණක් ඇති උපේක්ෂා සහගත පුද්ගලයා හැඟීමට වහල් නොවී, බාධකයන් ගෙන් කම්පා නොවී, උචිතානුචිත විවේක බුද්ධියෙන් යුතුව කෘත්‍ය සංවිධානයෙහි නිරත වෙයි. පරාර්ථ සේවයෙහි ලා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය, නායකත්වය හා සංවිධානය ඔහු ගෙන් ඉටු වෙයි.

සමාජයෙහි ක්‍රමික පරිණාමයට අනුරූපව සමාජ සේවකයා තුළද මේ අයුරින් ක්‍රමික ආධ්‍යාත්මික විකාශනයක් ඇති විය යුතුය. පොදු සාමාජික අවශ්‍යතාවන් හා සමාජ සේවකයාගේ ජීවන දෘෂ්ටිය අන්‍යෝන්‍ය සමාන්තරව ගමන් කරන කල සමාජය හා පුද්ගලයා අරබයා උභතෝකෝටික ප්‍රශ්න පැන නැඟිය නොහැක. සමාජය හා පුද්ගලයා අතර හටගත හැකි ගැටුම් රැසක් එමගින් වැළකෙයි.

තිරිසන් සමාජයේ ප්‍රකටව පැනෙන ප්‍රවෘත්ති ධර්මතාව බලවතා දුබලයා ගොදුරු කැරගැනීමේ මාත්ස්‍යන්‍යායයයි. උචිතයා ජයගැනීමෙන් (Survival of the fittest) කෙළවර වන ජීවන සංග්‍රාමයක් (Struggle for existence) තිරිසනුන් අතර බලපවත්වතැයි පරිණාමවාදීහු පළ කරත්. පොදු සත්ත්ව සමාජයෙහි ප්‍රකට ධර්මතා ආශ්‍රයෙන් මානව සංහතියේ පරිණාමය අරබයා විවිධ උපන්‍යාස ඉදිරිපත්

කරන ඇතැම් දාර්ශනිකයෝ මනුෂ්‍ය සමාජයද ප්‍රත්‍යනීක ධර්මයන්ගේ සංඝට්ටනයෙන් විකාශනය වෙතැයි නිගමනය කරත්. එබඳු උපන්‍යාසයක් මත ගොඩනැඟෙන සමාජ දර්ශනය පුද්ගල සන්තානයෙහි විෂම ලෝභය, ද්වේෂය හා ඊර්ෂ්‍යාව උද්දීපනය කරයි. මාත්ස්‍යන්‍යාය කරුණකොටගෙන තිරශ්චීන සමාජයෙහි බලපවත්නා ව්‍යාකූලත්වයම සූක්ෂ්ම ස්වරූපයෙන් මානව සමාජය තුළ ද උද්ගත වීම එහි අනිවාර්ය ප්‍රතිඵලයයි. යටකී විෂම මනෝ භාවයන් සමාජය තුළ අතිශය උග්‍ර අන්දමින් වර්ධනය වූ කල සමාජ ව්‍යාකූලත්වයද ඖදාරික ස්වරූපයක් ගනී. මනුෂ්‍යයෝ තමන් විසින් භාවිත තිරශ්චීන ආකල්පයෙහි ප්‍රතික්‍රියා වශයෙන් ඔවුනොවුන් කෙරෙහි මෘග සංඥාව උපදවා අවි ආයුධ මඟින් ඔවුනොවුන් දිවි තොරකැර ගනිති.[6]

මේ නයින් බලන කල සත්ත්ව සමාජයෙහි ප්‍රකටව පැනෙන මුත් විෂමලෝභය, ද්වේෂය හා ඊර්ෂ්‍යාව සමාජ ප්‍රගතියට මෙන් ම පුද්ගලාභිවෘද්ධියටද අහිතකරය. ප්‍රත්‍යනීක සම්බන්ධතා මඟින් ආත්මාර්ථය තහවුරු කර ගැනීමේ ඒකාංශික ප්‍රතිපදාව මානව සංහතියේ සමූලඝාතනයෙන් කෙළවර වන්නකි. **සතර බ්‍රහ්මවිහරණය තුළින් දිස්වන බෞද්ධ සමාජය දර්ශනය ආත්මාර්ථ - පරාර්ථ උභයාර්ථ සාධනයෙහි සමත් අන්‍යොන්‍යානය අනුග්‍රාහක සුහද මානව සම්බන්ධතා විදහා පායි.** සතර බ්‍රහ්ම විහරණයෙන් සාමාජික අවශ්‍යතාවන් සපුරාලන පුද්ගලයාගේ පෞරුෂයද ක්‍රමික විකාශනයෙන් බ්‍රහ්මත්වයට පත්වේ. සමාජ දර්ශනය විෂයෙහි බුදුන්වහන්සේ දක්වා වදාළ මෙම උත්කෘෂ්ට මධ්‍යම ප්‍රතිපදාව, හුදු තර්කයෙන් ආරෝපිත අස්වාභාවික න්‍යායයක් නොවේ. ස්වභාව ධර්මයෙහි සුලභතම ආදර්ශයක් වන දාරකස්නේහය එහි මූලධර්මය වන හෙයිනි.

# 2

# අධෝ ලිපි

1. බ්‍රහ්මාති මාතාපිතරෝ පුබ්බාචරියාති වුච්චරෙ

- දේවදූතවග්ග අං:නි:

2. මාතා යථා නියං පුත්තං ආයුසා එකපුත්තමනුරක්ඛෙ.................

- මෙත්ත සූත්‍රය

3. සසඳන්න: "තං කිම්මඤ්ඤසි රාජකුමාර: සචායං කුමාරො තුය්හං වා පමාදමන්වාය ධාතියාවා පමාදමන්වාය කට්ඨංවා කඨලං වා මුඛෙ ආහරෙය්‍ය, කින්ති නං කරෙය්‍යාසිති, - ආහරෙය්‍යස්සාහං භන්තෙ. සචෙ අහං භන්තෙ න සක්කුණෙය්‍යං ආදිකෙනෙව ආහත්තුං, වාමෙන හත්ථෙන සීසං පරිග්ගහෙත්වා දක්ඛිණෙන හත්ථෙන වඞ්කඞ්ගුලිංකරිත්වා සලොහිතම්පි ආහරෙය්‍ය, තං කිස්ස හෙතු: අත්ථි මේ භන්තෙ කුමාරෙ අනුකම්පා"

-අභයරාජකුමාර සුත්ත මං:නි:

4. මා තා යථා නියං පුත්තං ආයුසා එකපුත්තමනුරක්ඛෙ

එවම්පි සබ්බභූතෙසු මානසංභාවයෙ අපරිමාණං

-මෙත්ත සූත්‍රය.

5. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

-සාමඤ්ඤඵල සුත්ත-දීඃනි:

6. ........ දසවස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු සත්තාහං සත්ථන්තර කප්පො භවිස්සති, තෙ අඤ්ඤමඤ්ඤං මිගසඤ්ඤං පටිලභිස්සන්ති. තෙසං තිණ්හානි සත්ථානි හත්ථෙසු පාතුභවිස්සන්ති, තෙ තිණ්හෙන සත්ථෙන එස මිගො එස මිගො ති අඤ්ඤමඤ්ඤං ජීවිතා වොරොපෙස්සන්ති.

-චක්කවත්තිසීහනාදසුත්ත- දීඃනි:

# 03

# බෞද්ධ සමාජ දර්ශනයෙහි විශේෂ ලක්ෂණ

සමාජය හා පුද්ගලයා අතර සම්බන්ධතාව යථා පරිදි අවබෝධ කර ගැනීමට මෙන්ම තත් සම්බන්ධතාව කරණ කොට ගෙන පැන නගින ගැටළු සමුදාය නිරාකරණය කර ගැනීමටද ඉවහල් වන සමාජ දර්ශනයක් බුදු සමයෙහි ඉගැන්වීම් ඇසුරින් ගොඩනගා ගත හැකිය. චතුස්සත්‍ය පර්යාපන්න ලෝක දර්ශනය පසුබිම් කොට ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයට අනුකූලව කැරුණු සමාජ විග්‍රහයක් බුදු දහමෙහි ඇතුළත් වේ. සමාජයක පැවැත්ම, එහි අරමුණු හා එම අරමුණු උදෙසා ගත යුතු ක්‍රියා මාර්ගය පිළිබඳ අගනා දර්ශනයක් එයින් ඉදිරිපත් කැරෙයි.

**බුදුන් වහන්සේ ජාති- කුල- ගෝත්‍රාදී භේදයන් ඉක්මැවූ මානව සහෝදරත්වයක් කෙරෙහි මිනිසා ගේ අවධානය යොමු කළහ.** ජීව විද්‍යාත්මක සාධක අනුව, විවිධ වෘක්ෂ ලතාදීන් හා සත්ත්ව විශේෂයන් අතර විද්‍යමාන වන අන්දමේ ඒකාන්ත විවිධත්වයක් මනුෂ්‍ය වර්ගයා කෙරෙහි දක්නට නොලැබේ.[1] ජාති භේදයකට පදනම කර ගැනීමට තරම් ප්‍රබල වූ වෙනසක් මිනිසා ගේ අඟපසඟ පිළිබඳව දක්වාලිය නොහැකිය. එහෙයින් මානව සමාජය ජාති-කුල-ගෝත්‍රාදී වශයෙන් බෙදා දැක්වීම හුදෙක් කල්පිත සම්මුතියක්-දෘෂ්ටි මාත්‍රයක්- පමණකි.[2] කුල සම්මිශ්‍රණයට කොතෙකුත් ඉඩ ඇති හෙයින් ජන්ම පාරිශුද්ධිය කෙරෙහි විශ්වාසය තැබීම නිෂ්ඵලය.[3] ජන්මය මිනුම් දණ්ඩ කොට ගෙන ගොඩ නගා ගත් උස්-පහත් භේදය, දේශපාලනමය, ආර්ථික, සාමාජික හා ආචාරවිද්‍යාත්මක හේතූන් අනුව විපර්යාසයට භාජන වන අයුරු ද බුදුන් වහන්සේ පෙන්වා දුන්හ. යවනකාම්බෝජ දේශවාසීන්

අතර හා භාරතයෙහි ප්‍රත්‍යන්ත ජනපදවාසීන් අතරත් පැවති ආර්ය හා දාස යන දෙවැදෑරුම් කුල භේදය, පාලක - පාලිත දෙපක්ෂය හඟවන ව්‍යවහාරයක් විය. දෙපක්ෂය වරින් වර ඔවුනොවුන් පරයා දේශපාලන බලය ලැබීම හා සමඟ ආර්යයෝ දාසයෝ වෙති: දාසයෝ ආර්යයෝ වෙති.[4] එමෙන්ම ආර්ථික වශයෙන් සමෘද්ධියට පත් කුලහීනයකුට සිතැහි පරිදි කුලීනයකු තම දාසත්වයට පත් කරගත නොහැක්කේ නොවේ.[5] අපරාධකරුවනට සමාජයෙන් ගර්හාව හා දඬුවම් එල්ල වීමේ දී ද කුලභේදාදිය වැදගත් නොවේ. යමෙකුට සුචරිතයෙන් සුගතියක්, දුශ්චරිතයෙන් දුගතියත් හිමි වනුයේ කුල භේදයෙහි බලපෑමෙන් තොරවය.[6] කවර කුලයකට අයත් වූවකුට වුව ද නිවන පසක් කිරීමේ හැකියාව ඇත.[7] එහෙයින් බුදුන් වහන්සේ තත්කාලීන සමාජයෙහි පැවැති යට කී භේදයන් නොතකා සංඝ සමාජය සෑම කුලයකටම විවෘතව තැබූහ.[8]

ජාති මානය හා කුල මානය අනුව පැවැති අනම්‍යවූත්, නිර්දය වූත් සමාජ වර්ගීකරණය මෙසේ විවේචනයට ලක් කළ බුදුන් වහන්සේ, සමාජය කෙරෙහි සදය ආකල්පයකට තුඩු දෙන සුබනම්‍ය වර්ගීකරණයකට මඟ හෙළි කළහ. මෙම පරිවර්තනය සිදු කරන ලද්දේ **ජන්මය වෙනුවට කර්මය මිනුම් දණ්ඩ කොට ගැනීමෙනි.**[9] තමන් වහන්සේ **කර්මවාදියකු, ක්‍රියාවාදියකු, වීර්යවාදියකු** ලෙස[10] හඳුන්වා දුන් උන් වහන්සේ ලෝකය හා සමාජය ජංගම රථයකටත් කර්මය නමැති මූල ධර්මය එහි කඩ ඇණයටත් උපමා කළහ.[11] රියක කඩ ඇණය වනාහි රිය සකෙහි පෙරළීමට නිරතුරුවම අනුබල දෙන්නකි. මානව සමාජයද කර්ම කඩ ඇණය පිහිට කොට ගෙන ස්වකීය උද්යෝග ශක්තියෙන් පරිණාමයට පත් වේ. මිනිසා සම්‍යක් ව්‍යායාමයෙන් සුගතියටත්, මිථ්‍යා ව්‍යායාමයෙන් දුගතියටත් යයි. ඔහුගේ ප්‍රගතිශීලිත්වයට හෝ ප්‍රතිගාමිත්වයට හේතු වන මෙම කර්ම මූලධර්මය හුදෙක් ආචාර විද්‍යාත්මක අර්ථයකින් පමණක් නොව ආර්ථික- සමාජික අර්ථයකින් ගැනීමටද ඉඩ ඇත.[12] උට්ඨානවීර්යයෙන් යුතු කුලහීනයකුට පවා ආධ්‍යාත්මික

ව මෙන්ම ආර්ථික- සාමාජික අංශයන් ගෙන්ද ශ්‍රේෂ්ඨත්වයට පත් විය හැකිය. අධම පාපතරයකුට ලෝක පූජිතත්වයට පත්වීමටත් අන්ත දිළින්දෙකුට ධන කුවේරත්වයට පත්වීමටත් කර්ම මූලධර්මය උපකාරී වෙයි. සමාජය පිළිබඳ මෙම සුබනමා්‍ය, පරිණාමාත්මක දෘෂ්ටිය නිතැතින්ම සදය ආකල්පයකට අනුබල දෙයි. 'උසස්-පහත්' හෝ 'හොඳ-නරක' යනු විසින් ඉඳුරා දෙවැදෑරුම් වූ මානව සමාජයක් වෙනුවට එම දැඩි පරතරය මකාලන සුළු ඒකාබද්ධතාවකින් යුතු **සිවු වැදෑරුම් සමාජයක්** බුදුන් වහන්සේ දක්වා වදාළහ. **'තමො තමපරායණො'** ('අඳුරෙන් අඳුරට යන්නා') **'තමො ජොති පරායණො'** (අඳුරෙන් එළියට යන්නා) **'ජොති තම පරායණො'** ('එළියෙන් අඳුරට යන්නා') **'ජොති ජොති පරායණො'** ('එළියෙන් එළියට යන්නා')[13] යනුවෙන් විභජ්‍යවාදීව ගෙන හැර පෑ එකී සමාජ විග්‍රහයෙහි පදනම වූයේ මිනිසාගේ ඡවි වර්ණය වැනි බාහිර ලක්‍ෂණයක් නොව, කර්ම ශක්තියෙන් ඔහු උදා කැරැ ගන්නා ජීවන ආලෝකයයි. මෙහි නිර්දිෂ්ට සමාජ ප්‍රස්තර සතර පරිණාම ස්වරූපී සමාජයක් නිරූපණය කරයි. තමො ජොති පරායණො යන සමාජ ප්‍රස්තරය පිළිබඳව බුදු සමයෙන් අනුමත කැරෙන ආකල්පය මෙහි ලා විශේෂයෙන් වැදගත් වෙයි. **පළමුව දුසිරිතෙහි ගැලී සිට පසුව උට්ඨාන වීර්යයෙන් සුසිරිත් මඟට පිළිපන් පුද්ගලයා අඳුරු වළා ගැබින් මිදුණු සඳ මඬල මෙන් ලෝකය ආලෝකවත් කරතැයි බුදුන් වහන්සේ වදාළහ.**[14] මේ අනුව, මිනිසා ගේ ආධ්‍යාත්මික දුර්වලතා ඔහුගේ ආවේණික අංගයන් ලෙස නොව හුදෙක් ඔහුගේ නෛසර්ගික චිත්තප්‍රභාව වසාලන ආගන්තුක උපක්ලේශ රැසක් ලෙස සැලකේ.[15] සමාජය බ්‍රහ්ම නිර්මිත සංස්ථාවකැයිද, චතුර් වර්ණයට අනුව කැරුණු උස්-පහත් භේදය බ්‍රහ්මයාගේ සනාතන සංවිධානයකැයිද, තමන් බ්‍රහ්ම දායාද ලත් බ්‍රහ්ම බන්ධු පිරිසකැයි ද පළ කළ බමුණන් ගේ මිථ්‍යා දෘෂ්ටිය දුරු කිරීමට මෙන් වරක් බුදුන් වහන්සේ සුභ මානවකයාහට සමාජය විෂයෙහි කර්මයෙහි බලපෑම

මෙසේ විග්‍රහ කළහ. "මානවකය, සත්ත්වයෝ කර්මය ම තමා අයත් දෙය කොට ඇත්තාහ. කර්මය දායාදය කොට ඇත්තාහ. කර්මයම ප්‍රභවය කොට ඇත්තාහ. කර්මය ම නෑයන් කොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ. කර්මය ඒ මේ උස්-පහත් බැව් පිණිස සත්ත්වයන් බෙදන්නේය."[16] කර්මය නියති වාදයක් කොට නොගෙන, ප්‍රතීත්‍ය සමුත්පාද දර්ශනයට අනුකූල වන අයුරින් එය මිනිසා ගේ චේතනා ශක්තිය හා බැඳුණු නිතර එළඹ සිටි බලවේගයක් ලෙස ගත් කළ, මේ විග්‍රහය සමාජ ප්‍රගතියට මහ පෙන්වන්නක් වනු නිසැකය.

ජාති-කුල -ගෝත්‍රාදි වසයෙන් සමාජගතව පැවති භේදයන් සමහන් කිරීමෙන් නො නැවතුණු බෞද්ධ සමාජ දර්ශනය, පුද්ගලයා හා සමාජය අතර වූ සට්ටනය පිළිබඳවද එක්තරා විසඳුමක් ඉදිරිපත් කළේය. එකී සට්ටනය හමුවේ ඇතැම් කෙනෙක් ආත්මාර්ථයෙහිම තත්පර වූවෝ පරාර්ථය නොතකූහ. හුදු පරාර්ථයට කැප වූ තවත් කෙනෙක් ආත්මාර්ථය ගැන සිහි කිරීම පවා පාපයක් සේ සැළකූහ. බුදු සමයට අනුව මේ දෘෂ්ටිකෝණ දෙකෙහිම අන්තගාමී ලක්ෂණ ඇත. සමාජය යනු පුද්ගලයා ගෙන් පරිබාහිර වූ සත්තාවක් නොවේ. **පුද්ගල ඒකකයෙන් තොරව සමාජ සමස්තයක් ලද නොහැකිය. එහෙයින් බුදුන් වහන්සේ පුද්ගල ඒකකය පිළිබඳ මූලධර්ම මත පිහිටා එහි සාධාරණීකරණයෙන් පරාර්ථයෙහි අගය අවධාරණය කළහ.** 'සියලු දිසාවන්හිම සිත විහිදුවා පිරික්සුවද, තමාට තමා පමණ. ප්‍රිය වූ අනෙකෙක් නොමැත. අනුන්හටද වෙන් වශයෙන් මෙසේ තම තමා මැ ප්‍රිය වේ. එහෙයින් තම සැපත කැමැති තැනැත්තේ අනුනට හිංසා නොකට යුතුය'.[18] සියල්ලෝ දණ්ඩනයට බිය වෙත් 'සියල්ලෝ මරුට බිය වෙත්. එහෙයින් තමා උපමා කොට අනුන් නොනසන්නේය. නොමරවන්නේය'.[19] 'යමෙක් තම සැපය සොයමින් සැප කැමැති වූ සත්ත්වයනට හිංසා කෙරේද, හේ පරලොව සැපයක් නොලබයි.'[20] ලෝක සවභාවයට හා ව්‍යවහාරික බුද්ධියට අනුගුණ

ව සකස් වූ මැදුම් පිළිවෙතක් බඳු මෙම සරල න්‍යාය බෞද්ධ කුසලාකුසල විග්‍රහයෙහි එක් වැදගත් ලක්ෂණයකි. තමාගේත්, මෙරමා ගේත් පරිහානිය පිණිස පවත්නා කාය-වාග්-මනෝ කර්ම දුශ්චරිතය ලෙසත්, උභය පක්ෂයෙහි පරිහානියට හේතු නොවන කර්ම සුචරිතය ලෙසත් හැඳින් වේ.[21] එබැවින් තිදොරින් කිසියම් කර්මයක් කිරීමට පෙර එම කර්මය තමහට හෝ මෙරමාහට හෝ දෙපසටම හෝ වැඩදායී වේ දැයි ප්‍රත්‍යවේක්ෂා කට යුතුව ඇත.[22]

ආත්මාර්ථ- පරාර්ථ උභයාර්ථ සාධනය සුචරිතයෙහි හෝ කුසලයෙහි පරමාර්ථය පමණි. එහිලා ගත යුතු නිරවද්‍ය ක්‍රියා මාර්ගය නිගමනය කිරීමෙහි දී බුදු සමය වඩාත් ගැඹුරු මූලධර්ම විග්‍රහයක යෙදෙයි. 'දුක්ඛ' යන පදයෙන් සූචිත වූ පෞද්ගලික හා සාමාජික ගැටළු සමුදායයෙහි නිදානය ලෝභ, දෝස, මෝහ, යන චෛතසික ධර්මයන් තුළ දිස් වන බැව් බුදු සමයෙහි ඉගැන්වේ.[23] එහෙයින් මේ චෛතසිකයන්ගෙන් පෝෂිත වූ කාය-වාග්-මනෝ කර්මයෝ අකුසල පක්ෂයට යෙත්, අලෝභ, අදෝස, අමෝහ යන චෛතසිකයෝ පෞද්ගලික වූත්, සාමාජික වූත් ජටා විජටනයට හේතු භූත වෙත්. ඒ කුසල් මුල් කරණ කොට ගෙන පැන නඟින කාය-වාග්-මනෝ කර්මයෝ කුසල පක්ෂයෙහිලා ගැනෙත්. ආත්මාර්ථය හා පරාර්ථය යන පදද්වයෙහි අර්ථවත් බව රඳා පවතිනුයේ මේ කුසලා කුසල විග්‍රහය මතය. මෙවැනි සම්‍යක් දෘෂ්ටියකින් තොර වූ කල, ආත්මාර්ථකාමිත්වය මතු නොව පරහිතාධ්‍යාශය පවා අවැඩක්ම ගෙන දෙයි. සිය පියාගේ පිටෙහි වැසූ මදුරුවකු එළවාලීමට පොරව අතට ගත් ජනප්‍රවාදගත වඩු පුත්‍රයා තුළද එක්තරා පරහිතාධ්‍යාශයක් තුබුණි! ලෝභය හා ද්වේෂය දුරලා පරාර්ථය උදෙසා කැප වන කිසිවකු තුළ මෝහය නමැති අකුසල මූලය දැඩි ලෙස බල පැවැත්වීමට ඉඩ ඇත. එසේ කුසලාකුසල මුල් පිළිබඳව පැහැදිලි දර්ශනයකින් තොර වූ ඇතැම් බෞද්ධ දාර්ශනිකයන් පවා නොමඟ ගිය බැව් පෙනේ. මහා කරුණාව විමුක්ති යානයක් කැර ගත් ඇතැම් මහා යානිකයෝ,

භාවික ආවේගයනට අවනත වූවාහු, පරාර්ථය උදෙසා ප්‍රාණඝාතාදී අකුසල කර්ම කොට අපාගත වීමෙහි දොසක් නොදුටහ. "මෙරමා දුක තම දුක හා සම කොට තකන භාවිත සිත් ඇති බෝසත්වරු, හංසයින් පියුම් විලකට බසින්නාක් මෙන් අවීචි නිරයට බසිත්"[24] අයෝනිසෝමනසිකාරයෙන් සිදුවන මෙවැනි අතිධාවනයන් බුදු දහමෙන් කිසිසේත් අනුමත නොකැරෙන බව කිව යුතුය. 'බොහෝ වූ පරාර්ථය උදෙසා වුව ආත්මාර්ථය කැප නොකට යුතු ය.'[25] යන උපදෙස අර්ථවත් වනුයේ මෙහිදීය. තමා පාප මඩ වගුරෙහි ගැලී අනාථ වෙමින්, අනුන් එම මඩ වගුරෙන් ගොඩ ගැනීමට තැත් දැරීම අනුවණ ක්‍රියාවකි.[26] පරෝපකාරය පින් පිණිසත් පර පීඩනය පව් පිණිසත් හේතු වෙතැයි යනු 'ග්‍රන්ථ කෝටියකින් කියැවෙන ධර්මෝපදේශයන් ශ්ලෝකාර්ධයකින් හකුළා දක්වමින්' ඉදිරිපත් කැරුණු එක්තරා ආප්ත වාක්‍යයකි.[27] එසේද වුව, බෞද්ධ ආචාර වාදය අනුව එකී ආප්ත වාක්‍යය අංග සම්පූර්ණ නොවෙතැයි හැඟේ. වැඩිම සංඛ්‍යාවක ගේ වැඩිම යහපත ඉලක්කය කොට ගෙන ඊට තුඩු දෙන කවර උපාය මාර්ගයක් වුවද, නිවැරදි යයි දක්වාලන නූතන උපයෝගිතා වාදයද (Utilitarianism) එබඳුම දුර්වලතාවන් ගෙන් ගහණය. වැඩිම සංඛ්‍යාව හා වැඩි ම යහපත යන පදයන්ගේ නිර්වචනය පවා විවාදාපන්නය. එහෙයින්ම, උපාය මාර්ගයන්ගේ නියම් හෝ අනියම් බව නිගමනය කිරීමද සමාජ විද්‍යාඥයන්හට ගැටළුවක් වීය.

පුද්ගලයා හා සමාජය අතර සම්බන්ධතාවෙහි යථෝක්ත මූලධර්ම අනුව බුදුන් වහන්සේ සමාජ ව්‍යාකූලත්වය වළකා ප්‍රගතිය සලසන ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කළහ. පස් පවින් හා දස අකුසලින් වෙන්ව ඊට ප්‍රතිවිරුද්ධ කුසලයන්හි යෙදීම සමාජයෙහි සාමය, සමගිය හා සදාචාරය තහවුරු වීමට එකැතින්ම ඉවහල් වේ. පුද්ගල සන්තානයක භාවිත අලෝභ, අදෝස, අමෝහ චෛතසිකයන් කාය-වාග්-ද්වාරයන් ගෙන් ප්‍රකටව සමාජ ශුභ සිද්ධිය හා පුද්ගලාභිවෘද්ධිය සලසන අයුරු ඒ ශික්ෂා පද සියුම් ලෙස

විමසන්නකුට පැහැදිලි වනු ඇත. **මානව සම්බන්ධතාවන්හි දී භේදකර ප්‍රත්‍යනීක ධර්ම සංඝට්ටනය වළකා සුහද ප්‍රතිභාග ධර්මයන් ඉස්මතු කොට දක්වීම බෞද්ධ සමාජ දර්ශනයෙහි මූලික ලක්‍ෂණයකි.** මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර බ්‍රහ්ම විහරණයන්හි මෙම ලක්ෂණය මොනවට පිළිබිඹු වේ.[28] **දීඝ නිකායේ** සිගාලෝවාද සූත්‍රයෙහි නිර්දිෂ්ට ෂඩ්විධ මානව සම්බන්ධතාවන්හි පවා යට කී ලක්ෂණය දක්ක හැකිය. **මව්පිය- දූදරු, ගුරු-ගෝල, අඹු-සැමි, යහළු- මිතුරු, ස්වාමි- සේවක, ගිහි-පැවිදි** යන සමාජ කොටස් අතර අන්‍යෝන්‍යානුග්‍රාහක සුහදතාව උද්දීපනය වන අයුරින් යුතුකම් මාලාවන් එහි සංග්‍රහ කොට ඇත. ඔවුනොවුන්ගේ යුතුකම් සාපේක්ෂක මූලධර්මයෙන් සියුම් ලෙස සංයෝග වී ඇති හෙයින් යුතුකම් හා අයිතිවාසිකම් අතර සට්ටනය සමනය වේ. ඒ අනුව **එකකු ගේ යුතුකමෙහි පදනම අනිකාගේ අයිතිවාසිකමය.** හිතකර මානව සම්බන්ධතා ගොඩනැගීමට උපකාරීවන සංග්‍රහ වස්තු සතරක්ද සිගාලෝවාද සූත්‍රයෙහි එහි. **දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව, යන මෙම සිවුසඟරාවත් ජංගම රථයක කඩ ඇණය මෙන් සමාජ ප්‍රගතියට ඉවහල් වේ.**[29]

බෞද්ධ සමාජ දර්ශනයට අනුව, සමාජ ධර්ම පද්ධතියකින් පුද්ගලයා හා සමාජය අතර ගැටුම වළකාලීමේ දී පුද්ගල පෞරුෂය පිළිබඳ තෙ වැදෑරුම් ගැටුමක් ද සමනය කළ යුතු වේ. ඒ වනාහි සිත, කය හා වචනය අතර පවත්නා ගැටුමයි. සිතින් එකක් සිතා, බසින් අනිකක් කියා, කයින් අනිකක්ම කරන පුද්ගල සමූහයක් අතර යට දක් වූ අන්දමේ සුහද අන්‍යෝන්‍ය විශ්වාසයක් ඇති විය නොහැකිය. එමෙන්ම තෙදිසාවකට ඇරුණු තුන් දොරක් සහිත පුද්ගලයාගේ පෞරුෂය ද ක්‍රමික ඓන්ද්‍රීය සංවර්ධනයකට පත් නොවේ. වංකව, කුටිල ව වැඩෙන ඔහු තුළ නියම ආත්ම විශ්වාසයක් හෝ චරිත ශක්තියක් හට නොගනී. එබැවින් යථාවාදී- තථාකාරී බව සාමාජිකව මෙන්ම පෞද්ගලිකවද හිතකර වූ චරිතාංගයක්

ලෙස බුදු සමයෙහි සැලකේ. **පුද්ගල ඒකකය පිළිබඳ මූලධර්ම මත පිහිටා ගොඩ නැගුණු බෞද්ධ සමාජ දර්ශනයෙහි පරම නිෂ්ඨාව හුදෙක් පුද්ගල පෞරුෂයෙහි පුෂ්පෝද්භවයට උචිත පරිසරයක් බිහි කිරීම මය**. ඒ මිස, ඊශ්වර ප්‍රභූත වූ, නැතහොත් ඊශ්වරත්වය ආරෝපිත වූ කිසියම් සුවිශේෂ සංස්ථාවක චිරස්ථිතිය රැකීම එහි පරමාර්ථය නොවේ. බෞද්ධ සමාජ දර්ශනය **සන්තානගත පරිවර්තනයක අවශ්‍යතාව** උදක්ම අවධාරණය කරනුයේ එහෙයිනි. සිත-කය-වචනය-පිළිබඳ ව අවපල වූ ඒකාග්‍ර පෞරුෂයක් ගොඩ නැඟීමට සමත් ප්‍රතිපදාවක් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි දු පිළිබිඹු වේ. සම්‍යක් දෘෂ්ටියට ප්‍රතිභාග වූ ඊ ළඟ පියවර සම්‍යක් සංකල්පයයි. සම්‍යක් සංකල්පයට අනුරූපව ම සම්‍යක් වචනය වාග් ද්වාරයෙන් බිහි විය යුතුය. සම්‍යක් වචනය අර්ථවත් වනු වස් තදනුකූල වූ සම්‍යක් කර්මාන්තය කාය ද්වාරයෙන් ඉටු විය යුතුය. දෛනික ජීවිතය පුරා විහිද යන අයුරින් භාවිත වූ සම්‍යක් කර්මාන්තය සම්‍යගාජීවය බවට පත් වේ. සමාජගත පුද්ගලයා ගේ ආජීවය ආත්මාර්ථ පරාර්ථ උභයාර්ථ සාධනයට යෝග්‍ය පරිදි සකස් විය යුත්තේ මෙවැනි ක්‍රමික ඓන්ද්‍රෙය සංවර්ධනයකිනි.

පුද්ගල පෞරුෂයෙහි යට කී සංවර්ධනය නොතකන සමාජ දර්ශන ලොවෙහි සුලභය. අර්ථ ක්‍රමය මිනිස් සන්තානයට පිවිසෙන යතුරකැයි ගත් භෞතික වාදීහු, පුද්ගලයාගේ කායික වාචසික හා මානසික ක්‍රියාවලිය ආර්ථික සමෘද්ධිය අනුව නිතැතින් ම හැඩ ගැසෙතැයි අපේක්ෂා කරත්. එහෙයින් අනියම් උපාය මාර්ගයන් ගෙන් පවා ආර්ථික සංවර්ධනය සලසා ගැනීමට ඔවුහු පසු බට නොවෙති. ඒ පරමාර්ථය උදෙසා පුද්ගලයා හා සමාජය අතරත්, පුද්ගල පෞරුෂය තුළත් අහිතකර ඝට්ටන හට ගැන්වීමටද උත්සුක වෙත්. භෞතික වශයෙන් සමෘද්ධියට පත් එබඳු සමාජ සංස්ථාවක බල පවත්නා විචිත්‍ර දෘෂ්ටි වාද, ආදර්ශ පාඨ හා සාටෝප චාරිත්‍ර- වාරිත්‍ර විධීන් විනිවිද ගොස් පුද්ගල සන්තානයට එබී බලත හොත් එහි අන්‍යෝන්‍ය විශ්වාසයක් හෝ නියම ආත්ම විශ්වාසයක් විද්‍යමාන නොවනු ඇත.

මිනිසාගේ පෞද්ගලික හා සාමූහික වූ සියලුම ප්‍රයත්නයන්ගේ අවසාන පරමාර්ථය සුඛාන්වේෂණයයි. සුඛාන්වේෂණ ප්‍රවණතාව නිසි මඟට යොමු කිරීමට බුදු සමය දරූ ප්‍රයත්නය සමාජ දර්ශනය විෂයෙහිදු අගය කළ හැකිය. තමාගේ සුඛකාමිත්වය සාක්ෂි ස්ථානයෙහි තබා මෙරමාගේ සුඛකාමිත්වය සම්බන්ධව සහනශීලි වීමට බෞද්ධ ආචාර ධර්ම අනුබල දෙන බැව් යට කියන ලදී. ඒ හැරුණු විට, බුදුසමය කුසලාකුසල ව්‍යවහාරය අනුව සැපයෙහි විවිධ තත්ත්ව දක්වාලයි. මේ අනුව නිවන පරම සැපත සේ සැළකෙතත්, ගිහි කාමභෝගී පොදු ජන සමාජය සාමාන්‍යයෙන් නිවන් සැපත ආසන්න පරමාර්ථය සේ නොතකයි. එබැවින් බෞද්ධ සමාජ දර්ශනය, එබඳු සමාජයකට උචිත පරිදි ධාර්මික සුඛය විග්‍රහ කළේය. ගිහියා විසින් පවා සැප සෙවිය යුත්තේ කර්මය හා පුනරුත්පත්තිය පිළිබඳ විශ්වාසයකින් යුතුව නිවන් මඟද නො ඇවිරෙන අයුරිනි. **සැප සෙවීමෙහිලා ඔහු 'දෙඇස්' ඇත්තකු විය යුතුයයි බුදුන් වහන්සේ වදාළහ.** 'දෙ- ඇස' වනාහි මෙලොව සමෘද්ධිය හා පරලොව සුගතියයි.[30] ආත්මාර්ථ- පරාර්ථ උභයාර්ථය සම්බන්ධව දක්වුණු මැදුම් පිළිවෙත මෙන් මෙහිදීද ඓහ ලෞකික-පාර ලෞකික උභයාර්ථය සලසන මැදුම් පිළිවෙතක් ගැනීමට සිදු වේ. එයට සරිලන පරිදි මෙලොව සමෘද්ධිය සලසන සුකර ක්‍රියාමාර්ග පවා අකුසල් පක්ෂයට ගැනෙත හොත්, බුදු සමයෙන් ප්‍රතික්ෂේප වේ. එමෙන් ම, මානසික සුඛපරම වාදයකට *(Psychological Hedonism)* අවනතව ඇතැම් භෞතිකවාදීන් ඉදිරිපත් කරන මත වාද බුදු සමයට අනුව අගය කරතහොත් එකැස් අඳ හ්‍රස්ව දෘෂ්ටිසේ සැළකිය යුතු වෙයි.

සැපය අරමුණු කොට සමාජගත මිනිසා උපයෝගී කර ගන්නා විවිධ සාමාජික ආර්ථික හා දේශපාලන ව්‍යාපාරයෝ බෞද්ධ සමාජ දර්ශනයෙහි කෝවට හසුව අමුතු වටිනාකම් ලබමින් පරිවර්තනයකට භාජන වෙත්. අකුසලයට නැඹුරු වූ මත්පැන, දූ

කෙළිය වැනි විනෝදමාර්ග බුදු සමයෙන් අනුමත නොකැරෙයි. පස් කම් සැපතෙහි සමතාවකින් යුතු වූ අපිස්, දැහැමි ජීවිතය අගය කොට සැළකේ. භවභෝග සම්පත් උදෙසා මිනිසා ගෙන යන ආර්ථික ව්‍යාපාර කෙරෙහිද කුසලා කුසල විග්‍රහය බලපායි. ප්‍රාණඝාතාදියෙන් වෙන්ව සම්‍යගාජීවය ගෙවන්නකු ගේ ධනෝපායන ව්‍යාපාර සීමා සහිත වන බැව් බුදු සමය පිළිගනී. එහෙත් බෞද්ධ ජීවන හරයනට අනුව යට කී 'දෙ ඇසින්' බලන කල එවැනි ආර්ථික ප්‍රතිපත්තියක් අගය කළ යුතු වෙයි. 'මල නොතළා රොන් ගන්නා බමරකු මෙන් අනුන් නොපෙළා, නොපසු බට වීර්යයෙන් බාහු බලයෙන් හා දහදිය මහන්සියෙන් රැස් කර ගන්නා භෝග තුඹසක් මෙන් කෙමෙන් විපුලත්වයට පත් වෙතැයි'[31] දක්වා ඇත. ධාර්මිකව භෝග සම්පත් රැස් කළ පුද්ගලයා එයින් තෙමේ සැප විඳිනු පමණක් නොව, තම මව් පිය- දූදරු- දාස -කම්කරු - නෑ මිතුරු ඈ විසින් කෙමෙන් පුළුල් වන සමාජයක්ද සැපවත් කරයි. මසුරු මල දුරු කොට පරහිතාධ්‍යාශයෙන් දන් දෙන හේ ආධ්‍යාත්මික වසයෙන් මෙහ ලෞකික හා පාර ලෞකික අභිවෘද්ධිය සලසා ගනියි.

පෞද්ගලික අයිතිය පදනම් කොට ගත් සාම්ප්‍රදායික ආර්ථික රටාව පවා ඇතැම් විෂම ලක්ෂණයන් ගෙන් මුදාගත හැකි ආකාරය දක් වූ බුදු සමය, එයද ඉක්මවා සිටි වඩා ප්‍රශස්ත අර්ථ ක්‍රමයක් දෙසට මිනිසා ගේ අවධානය යොමු කළේය. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙහි දැක්වෙන පරිදි කල්පාරම්භයෙහි මිනිසා **පොදු අයිතිය** ආර්ථික මූල ධර්මය ලෙස ගෙන සාමකාමීව ස්වයංජාත හැල් පරිභෝග කළේය. වස්තු තණ්හාව ඔහු තුළ තහවුරු වී පෞද්ගලික අයිතිය දෙසට නැඹුරු වත් වත්ම, ශස්‍යයෙහි ස්වයංජාත ගුණය අතුරුදන් විය. සමාජයෙහි ප්‍රාණඝාතාදී අපරාධ පැන නැඟිණ. මිනිසා ගේ ආකල්පය අධර්මයෙන් දූෂිත වීම හා සමාන්තරව ඔහුගේ ආර්ථික හා සාමාජික සංවිධානයන් ද දූෂණය වූ අයුරු මෙම සූත්‍රයෙහි පිළිබිඹු වේ. **පොදු අයිතිය පිළිබඳව අග්ගඤ්ඤ**

**සූත්‍රයෙහි දක්වෙන උපදේශය, බුදුන් වහන්සේ ගේ සංඝ සංවිධානය තුළින් ආදර්ශයක් බවට පත් විය**. සංඝයාහට පිරිනැමෙන සියලු දේපොළ පෞද්ගලිකත්වයෙන් තොරව පොදුවේ සඟ සතු සේ සලකා පරිහරණය කළ යුතු විය. විහාර ආරාම **ආදිය සිවු දිගෙහි වූ පැමිණි නොපැමිණි සංඝයා උදෙසා**[32] පිරිනැමීම බෞද්ධ ගිහියන්ගේද චාරිත්‍රයක් විය. අල්පේච්ඡ ජීවනයට ප්‍රත්‍ය වශයෙන් සාංඝික ලාභයන් ගෙන් සිවු පසයට අදාළ එක්තරා කොටසක් පෞද්ගලිකව පරිහරණය කිරීම අනුදනිතත් එහිද ප්‍රවේණිගත වීමක් නොමැත. අපවත් වූ භික්ෂුවක ගේ පා සිවුරු ආදිය යළිත් සංඝයා සතු වන බැවිනි. උස් තැනක වට වැසි දිය ගලා ගොස් වළ ගොඩැලි පුරවා ලන්නාක් මෙන් සංඝයාහට ලැබෙන අතිරේක ලාභයන් පවා බහුභාණ්ඩිකත්වයෙන් තොරව සමතාවකින් යුතුව බෙදා ගැනීමේ ක්‍රමවත් සංවිධානයක් විනය පිටකයෙන් හෙළි වේ. ගිහියකු විසින් දනට ඇරයුම් කළ කල, එහි වැඩිය යුතු භික්ෂුන් තෝරා ගනු ලබන්නේ සලාක ක්‍රමයක් අනුවය. උපභෝග පරිභෝග වස්තූන් මිනිසාගේ ජීවනයට ප්‍රත්‍යය වනු මිස ජීවනයෙහි පරමාර්ථය නොවන බැව් බෞද්ධ සාංඝික ප්‍රතිපත්තිය මැනවින් විදහා පායි.

දේශපාලනය විෂයෙහි එතෙක් ප්‍රචලිතව පැවැති චින්තාවන් සුමඟට යොමු කැරැවීමට බෞද්ධ දර්ශනය තැත් දැරීය. රාජ්‍යත්වය මුල් කැරැගත් සංකේන්ද්‍රීය පාලන ක්‍රමය එවකට ජනප්‍රියව පැවතිණ. රජු සෞභාග්‍යයේ හා විජයග්‍රහණයේ සංකේතය විය. දේශ දේශාන්තරයන් දිනා සාම්‍රාජ්‍යය හිමි කර ගැනීමේ අභිලාෂයක් රජුන් තුළ විය. එම විචිත්‍ර, කාල්පනික පරමාර්ථය මුදුන් පත් කැරැ ගනු වස් උපත ලබන භාග්‍ය සම්පන්න 'මහා පුරුෂයකු' පිළිබඳ විශ්වාසයක් ද බමුණු පූජක සමාජය ඇසුරින් බිහි විය. මහා පුරුෂ ලක්ෂණයන් ගෙන් හෙබි 'චක්‍රවර්ති' නම් වූ එබඳු අධිරාජයකු ගේ රාජෝදය ලෞකික ශ්‍රී විභූතියෙහි ස්වර්ණ යුගය වෙතැයි පොදු ජනයා සැළකූහ. රාජ්‍යත්වය හා බැඳී පැවැති

මෙවැනි සිතුම් පැතුම් බුදු දහමේ ප්‍රභාවයෙන් නව්‍ය ස්වරූපයක් ගැනීමට විය. ධර්මය දේශපාලනයෙහි ද මාර්ගෝපදේශකත්වය ගත්තේය. චක්‍රවර්ති රජු ධර්මයෙහි සංකේතයක්-ධර්මධ්වජයක්-බවට පත් විය. ධම්මිකො ධම්මරාජා නම් ලත් ඔහුට ජය කුන්තය බඳු වූ දිව්‍යමය චක්‍ර රත්නය පහළ වනුයේ ද පුන් පොහෝ දින පෙහෙවස් සමාදන් ව සිටිය දීය. සක්විති රජුගේ දිග් විජය, ධර්ම විජයක් බවට පරිවර්තනය විය. ඔහු සියලු පොළෝතලය දිනනුයේ දණ්ඩෙන් හා අවි බලයෙන් තොර ධර්ම යුද්ධයකිනි.[33] රජු ගේ ආයාචනයෙන් සිවු දිගට පෙරළෙන චක්‍ර රත්නය අනුව රජු සිවුරඟ සෙනඟ හා යෙයි. ඒ ඒ දිශායෙහි වූ විරුද්ධ රජ දරුවෝ සිය කැමැත්තෙන්ම සක්විති රජු වෙත එළඹ සිය රාජ්‍යයන් ඔහුට පාවාදී ඔහුගේ අනුශාසනය පතති. සක්විති රජද පස් පවින් වළකින ලෙස ඔවුනට අනුශාසනා කොට ඔවුන් ගේ රාජ්‍යයන් පෙරළා ඔවුනටම පවරා දෙයි. සක්විති රජු විසින් රාජ්‍ය පාලනයෙහිලා අනුගමනය කළ යුතු සක්විති වත් කිහිපයක් වේ. සිය රටෙහි වසන ජනතාවට හා තිරිසනුන්ට දැහැමි රැකවරණ සැලසිය යුතුය. කලින් කල මහණ බමුණන් වෙත එළඹ කුසල් අකුසල් විචාළ යුතුය. දුගියනට ධනය දිය යුතුය. රජු ධාර්මික අංශයෙන් මෙන්ම ආර්ථික අංශයෙන්ද අප්‍රමාද විය යුතු බව, නිර්ධන පක්ෂයට ආර්ථික රැකවරණය නොසැලසීම කරණ කොට ගෙන එක් සක්විති රජකු ගේ රාජ්‍යය පිරිහීමට පත් වූ පුවතින් පෙනේ.[34]

බුදු සමයෙහි එන චක්‍රවර්ති සංකල්පය හා සම්බන්ධ වෘත්තාන්ත නිසරු සුරංගනා කථා ලෙස මෙකල ඇතැමෙකුගේ අවඥාවට ලක් වනු නොබැරිය. මේ උපදේශාත්මක වෘත්තාන්තයෙන්ගේ බාහිර ස්වරූපය කෙසේ වුවද, එමගින් මිනිසා හමුවෙහි තබන දේශපාලන දර්ශනය වැදගත් වෙයි. තමන් දැඩිව එල්බ ගත් දේශපාලන න්‍යාය ධර්මය මගින් උතුරුකුරු දිවයින් සමාජයක් *(Social Utopia)* බිහි කිරීමේ පරමාර්ථය බොහෝ විට දේශපාලනඥයින් තුළ බල පවත්වයි.

එම කාල්පනික අරමුණෙහි විචිත්‍රත්වය ඔහුගේ ක්‍රියා ශක්තිය මෙහෙයැවීමෙහිලා  උත්තේජකයක් වෙයි. දිග් විජයෙන් ලබන සාම්‍රාජ්‍යය පිළිබඳ සිහිනය ද එවැනි විචිත්‍ර, කාල්පනික අරමුණකි. කෲරතර මනුෂ්‍ය ඝාතනයකින් ඒ අරමුණ සොයා ගිය පුද්ගලයෝ ලෝක ඉතිහාසයෙහි විරල නොවෙත්. බුදු සමයෙහි දක්වෙන ධර්ම විජයෙන් ලබන සාම්‍රාජ්‍යය වනාහි යට කී මානසික ප්‍රවණතාවට විෂය වන සේ ඉදිරිපත් කැරුණු විචිත්‍ර කාල්පනික අරමුණකි. එයින් සමුත්තේජිත වූ ධර්මාශෝක රජු අවිහිංසාව හා භූත දයාව පදනම් කොට ගත් උදාර ක්‍රියා මාර්ගයන් ගෙන් ස්වකීය අරමුණ සොයා ගියේය. අරමුණු දෙකෙහි අගය උරගා බැලිය යුත්තේ එක් එක් අරමුණ කරණකොට ගෙන ලොවට උදා වූ ශුභ සිද්ධිය මතය.

සක්විති රජුගේ ධර්ම රාජ්‍යයට අනුරූපව රාජ්‍යත්වය පිළිබඳ පොදු බෞද්ධ සංකල්පය හැඩ ගැසිණ. පසමිතුරන් නිතැතින් මෙන් යටත් කර ගැනීමේ පුණ්‍ය තේජසක් සාමාන්‍ය රජෙකුට නොමැති වුවත්, ඔහුද රාජ්‍ය පාලනයෙහිලා ධර්මයම ගුරු තන්හි තබයි. බමුණු පුරෝහිතයන් විසින් නිර්දිෂ්ට වූ සාම- දාන- දණ්ඩ- භේද යන කුටිල උපාය මාර්ගයන් වෙනුවට ඔහු දශ රාජ ධර්මයන් පිළිපදියි. දානය, ශීලය, පරිත්‍යාගය, ඍජු බව, මෘදු බව,  තපෝ ගුණය, ක්‍රෝධ විරහිත බව, අවිහිංසාව, ඉවසීම, හා අවිරුද්ධ බව[35] යන දශ රාජ ධර්මයන් ගෙන් ප්‍රකට වනුයේ රජකු තුළ තිබිය යුතු ධාර්මිකත්වයය. ඔහුගේ ආදර්ශය අනුව රට වැසියා  හැඩ ගැසීම සාමාන්‍ය ස්වභාවය හෙයින්ද ඔහුගේ භාරදූර වගකීමට සරිලන පෞරුෂයක් අත්‍යවශ්‍ය හෙයින්ද රජු ධාර්මික විය යුතු යයි දක්වා ඇත. වැසියන් ගේ අය බදුවලින් යැපෙන්නකු හෙයින් ඔවුන්ගේ හිත සුව සැලසීම රජකුගේ පරම යුතුකම බවද අවධාරණය කැරෙයි.

රාජ්‍යත්වය ධර්මයේ පාලනයට ගැනීමෙන් එහි අත්තනෝමතික දූෂිත අංගයන් බෙහෙවින් බැහැර කැරුණු මුත් බුදු සමයෙහි දේශපාලන දර්ශනය ඒ පාලන ක්‍රමයෙන් සීමා කරනු නොලැබීය. සංඝ සංවිධානයට පදනම් වූ පාලන තන්ත්‍රය වඩා සූක්ෂම දේශපාලන දර්ශනයක් පිළිබිඹු කරයි. නායකයකු වෙනුවට ධර්මය හා විනය ප්‍රමාණ කොට ගත්, ප්‍රජාතාන්ත්‍රික මූල ධර්මයනට අනුකූල වූ, සමූහාණ්ඩු ස්වරූපී විමධ්‍යගත පාලන ක්‍රමයක් සංඝ සමාජය සතු විය. සම්මත කර ගනු ලැබූ එක් එක් සීමාව තුළ වසන සියලුම භික්ෂූන් ගේ සාමාජිකත්වයෙන් යුතු සංඝ සමාජයක්, උපෝසථ සංඝ කර්ම ආදියෙන් ස්වකීය පාලන හා අධිකරණ ප්‍රශ්න විසඳා ගනී. සංඝ කර්මයක් සඳහා පැමිණිය නොහැකි වන්නකු විසින් අනිකකු අත සිය ඡන්දය දන්වා යැවිය යුතුය. යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව එය සංඝයා හමුවෙහි එක් වරක් හෝ තෙවරක් කියවා සම්මත කර ගනිත්. ඒකමතිකත්වය නොලද හැකි ඇතැම් ප්‍රශ්නයන්හි දී සලාක ක්‍රමයකින් ඡන්දය විමසනු ලැබේ. ගණපූරණය නියම කිරීම, විශේෂ කාර්යයන් උදෙසා සංඝ සම්මුතියෙන් නිලධාරීන් හා කමිටු පත් කර ගැනීම වැනි සභා රීති ද උපයුක්ත වේ. සංඝ සමාජය තුළ බුදුන් වහන්සේ අනුදත් පාලන ක්‍රමයට බෙහෙවින් ළං වූ ගණතන්ත්‍ර පාලන ක්‍රමයක් තත් කාලීන භාරතයේ විකාශනය වෙමින් පැවතිණ. එවැනි පාලන ක්‍රමයක ඇතැම් ලක්ෂණ බුදුන් වහන්සේ ගේ ප්‍රශංසාවට ලක් විය. මහාපරිනිබ්බාන සූත්‍රයට අනුව වජ්ජි රජ දරුවන් අතර පැවැති උසස් සම්ප්‍රදායයන් රැසක් 'අපරිහාණිය ධම්ම' නමින් හඳුන්වා දුන් උන් වහන්සේ ඊට අනුරූප වූ ප්‍රතිපත්ති මාලාවක් සංඝයා උදෙසා අනුමත කළහ.

මානව ශිෂ්ටාචාරය යුගයෙන් යුගයට විකාශනයට පත් වීමේ දී මිනිසා විවිධ සාමාජික, ආර්ථික හා දේශපාලන දෘෂ්ටි වාදයන් අත්හදා බලයි. විටෙක විප්ලවයකින් දුක සේ බිහි කොට ගත් සංස්ථාවක් තවත් විටෙක යල් පැන ගිය එකක් සේ සළකා

අවඥාවෙන් බැහැරලයි. කාලීන අගයකින් යුත් සමාජ දර්ශනයක් ගොඩ නඟා ගැනීමට ඔහු තුළ ඇති අභිලාෂය, සංස්ථාවන්ගේ ඇදහැලීම හා සමඟ බිඳ වැටෙයි. කෙසේ වුවද මිනිස් සන්තානයෙහි සංකීර්ණ ක්‍රියාකාරිත්වය හා ලෝක ස්වභාවය පිළිබඳ යථාභූත දර්ශනයක් මත සකස් වූ බෞද්ධ සමාජ දර්ශනය සංස්ථාවන්ගේ බාහිර ස්වරූපයෙන් සීමා නොවෙයි. එබැවින් මානව ශිෂ්ටාචාරය හමුවෙහි සනාතන මාර්ගෝපදේශකයකු වීමට පවා සමත් ශක්තියක් ඒ සතුව ඇත.

# 3

# අධෝ ලිපි

1. වාසෙට්ඨ සූත්‍රය, සුත්ත නිපාත

2. සමඤ්ඤාහෙ සා ලොකස්මිං - නාමගොත්තං පකප්පිතං

   සම්මුච්චා සමුදාගතං - තත්ථ තත්ථ පකප්පිතං

   දීඝරත්තං  අනුසයිතං - දිට්ඨිගතං අජානතං

   අජානන්තා නො පබ්‍රැවන්ති- ජාතියා හොති බ්‍රාහ්මණො

   එම

3. අස්සලායන සූත්‍රය, මජ්ඣිම නිකාය.

4. අස්සලායන සූත්‍රය, මජ්ඣිම නිකාය

5. මධුර සූත්‍රය, මජ්ඣිම නිකාය.

6. මධුර සූත්‍රය, මජ්ඣිම නිකාය; වසල සූත්‍රය, සුත්ත නිපාත.

7. කණ්ණකත්ථල සූත්‍රය, මජ්ඣිම නිකාය

8. සෙය්‍යථාපි භික්ඛවේ යා කාචි මහානදියො, සෙය්‍යථීදං ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී තා මහාසමුද්දං පත්තා ජහන්ති පුරිමානි නාමගොත්තානි, මහාසමුද්දෝත්වෙච සඞ්ඛං ගච්ඡන්ති, එවමෙව බො භික්ඛවෙ චත්තාරො මෙ වණ්ණා ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා සුද්දා තෙ තථාගතප්පවෙදිතෙ ධම්මවිනයෙ අගාරස්මා අනගාරියං පබ්බජිත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි, සමණා සක්‍යපුත්තියාත්වෙච සංඛං ගච්ඡන්ති.

   පාතිමොක්ඛඨපනඛන්ධක , විනය චුල්ලවග්ග.

9. න ජච්චා වසලො හොති - න ජච්චා හොති බ්‍රාහ්මණො

   කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො

   වසල සූත්‍රය, සුත්ත නිපාත.

10. 'අහම්පි භික්ඛවෙ එතරහි අරහං සම්මාසම්බුඩො, කම්මවාදො කිරියවාදො විරියවාදො'

- යොධාජීව වග්ග, අංගුත්තර නිකාය.

11. කම්මනා වත්තතී ලොකො - කම්මනා වත්තතී පජා

කම්මනිබන්ධනා සත්තා- රථස්සාණීව යායතො

- වාසෙට්ඨ සූත්‍රය, සුත්ත නිපාත.

12. යොහි කොචි මනුස්සෙසු - වොහාරං උපජීවති

එවං වාසෙට්ඨ ජානාහි- වාණිජො සො,න බ්‍රාහ්මණො

- එම

13. මචල වග්ග, චතුක්ක නිපාත, අංගුත්තර නිකාය.

14. යො ච පුබ්බේ පමජ්ජිත්වා- පච්ඡා සො නප්පමජ්ජති

සො ඉමං ලොකං පභාසෙති - අබ්භාමුත්තො ච චන්දිමා

- ලෝක වග්ග, ධම්මපද.

15. 'පභස්සරමිදං භික්ඛවේ චිත්තං, තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං'

- පඤ්චම වග්ග, එකක නිපාත, අංගුත්තර නිකාය.

16. "කම්මස්සකා, මාණව, සත්තා, කම්මදායාද, කම්මයොනි කම්මබන්ධු කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය"

- චූලකම්මවිභඞ්ග සූත්‍රය , මජ්ඣිම නිකාය.

17. ....එවමෙතං යථාභූතං - කම්මං පස්සන්ති පණ්ඩිතා

පටිච්ච සමුප්පාද දසා - කම්මවිපාක කෝවිදා

- වාසෙට්ඨ සූත්‍රය, සුත්ත නිපාත.

18. සබ්බාදිසා අනුපරිගම්ම චෙතසා - නෙවජ්ඣගා පියතරමත්තනා ක්වචි

එවං පියො පුථු අත්තා පරෙසං - තස්මා න හිංසෙ පරමත්තකාමො

- මල්ලිකා සූත්‍රය, කෝසල සංයුත්ත, සංයුත්ත නිකාය.

19. සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායන්ති මච්චුනො

අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයෙ

- දණ්ඩ වග්ග, ධම්මපද.

20. සුඛකාමානි භූතානි - යො දණ්ඩෙන විහිංසති

අත්තනො සුඛමෙසානො - පෙච්ච සො න ලභතෙ සුඛං

- එම

21. "තයො මෙ භික්ඛවෙ ධම්මා අත්තබ්‍යාබාධාය පි සංවත්තන්ති, පරබ්‍යාබාධාය පි සංවත්තන්ති, උභයබ්‍යාබාධාය පි සංවත්තන්ති කතමෙ තයො, කාය දුච්චරිතං, වචී දුච්චරිතං, මනො දුච්චරිතං... තයො මෙ භික්ඛවෙ ධම්මා නෙවත්තබ්‍යාබාධාය පි සංවත්තන්ති න පරබ්‍යාබාධාය පි සංවත්තන්ති න උභයබ්‍යාබාධාය පි සංවත්තන්ති, කතමෙ තයො, කාය සුචරිතං, වචී සුචරිතං, මනො සුචරිතං," තික නිපාත, අංගුත්තර නිකාය.

22. අම්බලට්ඨිකා රාහුලොවාද සූත්‍රය, මජ්ඣිම නිකාය.

23. සම්මදිට්ඨි සූත්‍රය, මජ්ඣිම නිකාය, සක්කපඤ්හ සූත්‍රය, දීඝ නිකාය, කලහ විවාද සූත්‍රය, සුත්ත නිපාත.

24. එවං භාවිත සන්තානාඃ - පරදුඃඛ සමප්‍රියාඃ

අවිචිමවගාහන්තෙ - හංසාඃ පද්මවනං යථා

ශික්ෂා සමුච්චය, 19 පරිච්ඡෙදය.

25. අත්තදත්ථං පරත්ථෙන - බහුනා පි න හාපයෙ

අත්තදත්ථං අභිඤ්ඤාය- සදත්ථපසුතො සියා

- අත්තවග්ග, ධම්මපද

26. සල්ලෙඛ සූත්‍රය, මජ්ඣිම නිකාය.

27. ශ්ලෝකාර්ධෙන ප්‍රවක්ෂ්‍යාමි - යදුක්තං ගන්ථකොටිෂු

පරොපකාරඃ පුණ්‍යාය - පාපාය පරපීඩනං

28. සංස්කෘති - 12 කලාපය 3 සඟරාව (1965) පිටු 38-44

29. දානං ච පෙය්‍ය වජ්ජඤ්ච- අත්ථචරියාච යා ඉධ

සමානත්තතා ධම්මේසු - තත්ථ තත්ථ යථාරහං

එතෙ ඛො සංගහා ලොකෙ - රථස්සාණී ච යායතො

එතෙ ඛො සංගහා නාස්සු - න මාතා පුත්තකාරණා

ලභෙථ මානං පූජං වා - පිතා වා පුත්තකාරණා

30. "...... කතමොච භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛු, ඉධ භික්ඛවෙ එකච්චස්ස පුග්ගලස්ස තථාරූපං චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා අනධිගතං වා භොගං අධිගච්ඡෙය්‍ය අධිගතං වා භොගං ඵාතිකරෙය්‍ය, තථාරූපම්පිස්ස චක්ඛු හොති, යථාරූපෙන චක්ඛුනා කුසලාකුසලෙ ධම්මෙජානෙය්‍ය සාවජ්ජානවජ්ජේ ධම්මේ ජානෙය්‍ය, හීනප්පණීතෙ ධම්මේ ජානෙය්‍ය කණ්හසුක්කසප්පටිභාගෙ ධම්මෙ ජානෙය්‍ය, අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ද්විචක්ඛු "

- තික නිපාත, අංගුත්තර නිකාය.

31. පණ්ඩිතො සීලසම්පන්නො - ජලමග්ගීව භාසති

භොගෙ සංහරමානස්ස- භමරස්සෙව ඉරීයතො

භොගා සන්නිචයං යන්ති- වම්මිකො වූපචීයති.

- සිඟාලොවාද සූත්‍රය, දීඝනිකාය.

32. ආගතානාගතස්ස චාතුද්දිසස්ය සංඝස්ස........

- විනයචුල්ලවග්ග, vi ඛන්ධකය

33. සො ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසි.

- චක්කවත්තිසීහනාද සුත්ත, දීඝනිකාය.

34. චක්කවත්තිසීහනාද සුත්ත, දීඝනිකාය.

35. දානං සීලං පරිච්චාගං- අජ්ජවං මද්දවං තපං

අක්කොධො අවිහිංසා ච - ඛන්තී ච අවිරෝධනං

- නන්දියමිග ජාතක

# 04

# සතර සංග්‍රහ වස්තු

## (පහන් කණුව ධර්ම දේශනා අංක 140)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

දානංච පෙය්‍යවජ්ජඤ්ච
අත්ථචරියාච යා ඉධ
සමානත්තතාච ධම්මෙසු
තත්ථ තත්ථ යථාරහං

එතෙ ඛො සංගහා ලොකෙ
රථස්සාණීව යායතො
එතෙච සංගහා නාසසු
න මාතා පුත්තකාරණා
ලභෙථ මානං පූජංවා
පිතා වා පුත්තකාරණා

යස්මා ච සංගහා එතෙ
සමවෙක්ඛන්ති පණ්ඩිතා
තස්මා මහත්තං පප්පොන්ති
පාසංසාච භවන්ති තෙ

-අංගුත්තර නිකාය චතුක්ක නිපාත

සැදැහැවත් පින්වතුනි,

දුරුතු පෝය දවස ව්‍යවහාර වර්ෂ ක්‍රමයට අනුව අවුරුද්දක පළමු පෝය දවසයි. අවුරුද්දක් ආරම්භ වෙනකොට හැම කෙනෙක්ම

වගේ තම තමන්ගේ අනාගත දියුණුව, ප්‍රගතිය, ඉදිරිගමන, ගැන හිත යොදවනවා. තිලෝගුරු බුදුරජාණන් වහන්සේ පුද්ගලයාගේත් සමාජයේත් ඉදිරිගමනට ප්‍රගතියට හේතුවන වටිනා කාරණා හතරක් දක්වා වදාළ ගාථා කීපයකුයි අද අපි මාතෘකාව හැටියට ගත්තේ. ගමන් කරන රථයකට කඩ ඇණය උපකාර වෙන්නා වගේ සමාජයේ ප්‍රගතියට උපකාර වෙන ධර්ම කාරණා හතරක් තමයි බුදුරජාණන් වහන්සේ මේ ගාථා තුළින් ඉදිරිපත් කරන්නේ.

**දානංච පෙය්‍යවජ්ජඤ්ච**
**අත්‍ථචරියාච යා ඉධ**
**සමානත්තතාච ධම්මේසු**
**තත්‍ථ තත්‍ථ යථාරහං**

දානය - දීම - දන්දීම කවුරුත් දන්නවා. පෙය්‍යවජ්ජ කියල කියන්නේ ප්‍රියවචනයයි. එතකොට දානය ප්‍රිය වචනය ඊළඟට අර්ථචර්යාව. අර්ථචර්යාව කියල කියන්නේ අනුන්ගේ යහපතට ක්‍රියාකිරීම. දන් මේ කාලයේ පරාර්ථ චර්යාව කියල යෙදෙන්නේ ඒකයි. 'සමානත්තතාච ධම්මේසු තත්‍ථ තත්‍ථ යථාරහං' -එතන ටිකක් අමුතු විදියටයි ප්‍රකාශ කරන්නේ. ඒ ඒ අවස්ථානුකූල, ඒ ඒ තැන්හි සුදුසු පරිදි, සමානාත්මතාව. ඒකයි හතරවෙනි කාරණය. 'සමානත්තතාච ධම්මේසු - තත්‍ථ තත්‍ථ යථාරහං'. ඊ ළඟට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනව **'එතෙ බො සංගහා ලොකෙ - රථස්සාණී ච යායතො'** - මේ සංග්‍රහ වස්තු හතර, ලෝකයට ගමන් කරන රථයට කඩ ඇණය වගේ උපකාර වෙනවා කියන එකයි ඊළඟට ප්‍රකාශ කරන්නේ. ඊළඟට වදාළා **'එතෙච සංගහා නාසසු'** මේ සංග්‍රහ වස්තු නැතිනම් **'න මාතා පුත්ත කාරණා ලභෙථ මානං පූජංවා පිතා වා පුත්ත කාරණා** මවක් පුත්‍රයා නිසා ගරු බුහුමන් ලබන්නේ නැත. පියෙක් පුතාගෙන් ගරු බුහුමන් ආදිය ලබන්නේ නැත. පූජාවන් ලබන්නේ නැත. ඊළඟට ප්‍රකාශ කරනවා **'යස්මාච සංගහා එතෙ සමවෙක්ඛන්ති පණ්ඩිතා'** යම් හේතුවකින් පණ්ඩිතයෝ නුවණැත්තෝ, මේ සංග්‍රහ වස්තු

නුවණින් සළකා වටහා ගනිත්ද **'තස්මා මහත්තං පප්පොන්ති'** ඒ නිසා ඒ හේතු කොට ගෙන ඔවුහු මහත් බවට, විපුල බවට, උසස් බවට පත් වෙනවා. **'පාසංසාව භවන්ති තෙ'** ප්‍රසංසනීය වෙනවා. ඔන්න ඕකයි එතකොට මේ ගාථාවල අදහස.

දැන් එතකොට අපි මේ මෙතන කියාපු සමහර කාරණා දැනටම බොහෝ දෙනාට ප්‍රකටයි. දානය කියන එක අපට කණට හුරුයි. අපි කවුරුත් දන්නවා මෙතන දීමනාව කියන එක තුළ දෙපැත්තක් තිබෙනවා. සාමාන්‍යයෙන් දානය දීමනාව කියනකොට අතින් අතට මාරු කිරීමක් වගේ හැඟෙන්නේ. නමුත් දානයට යටින් යම් යම් ආකල්පමය වෙනසක් තිබෙනවා. දැන් මේ දීමනාව කෙරෙන්නේ, දැන් යම් යම් අයගෙන් ඇතැම් කෙනෙක් අවස්ථානුකූලව තමන්ගේ අගහිඟකම් නිසා යමක් ඉල්ලගෙන එනවා. ඒ අවස්ථාවේ සුළු නමුත් ඒ උවමනාව පිරිමැසීම ඒ තැනැත්තාට විශාල සහනයක්. අන්න එබඳු අවස්ථාවක දානය බලාපොරොත්තු වන කෙනාට දීමනාව දෙන්ට ඕනෑ. තවත් ඇතැම් අවස්ථාවක කෙනෙක් දීමනාව නොවේ බලාපොරොත්තු වන්නේ ප්‍රියවචනයක්. සමාජයේ සමහර අය ඉන්නවා කියනවා ඒ අය මොකක්වත් නුදුන්නත් කමක් නැහැ වචනයම මසුරන් වටිනවා කියලා. අර ප්‍රිය වචනය කියලා කියන කවුරුත් දන්නවා. 'ඵරුසා වාචා' කියන පරුෂ වචනය කාටත් අම්හිරි වගේම ප්‍රිය වචනය කණට මිහිරියි. 'යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයංගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා' ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේ අර ප්‍රියවචනය විස්තර කරලා තියනවා. යම් වචනයක් තිබෙනවා නම් 'නෙලා' නිදොස්, 'කණ්ණසුඛා' කණට ප්‍රියයි, 'පෙමනීයා' ප්‍රේමය ඇතිවෙනවා, 'හදයංගමා' හෘදය ඇතුළටම යනවා. 'පොරී', පෞරී - සභ්‍යයි, බහුජන කන්තා' බොහෝ දෙනා ඇදිලා එනවා බහුජන මනාපා බොහෝ දෙනාට ප්‍රිය වෙනවා. අන්න එබඳු වචන අවස්ථානුකූල එබඳු වචන, ඇතැම් විට වැඩි දෙයක් නොවේ සමාජයේ ඔය 'අම්මේ තාත්තේ අයියේ අක්කේ' කියන වචන වල පවා ඒ වචනත්

එක්කම යන ප්‍රිය හැඟීම්- ඒ වගේ ප්‍රිය වචන ඇතැම් කෙනෙක් එහෙම එකක් බලාපොරොත්තු වෙනවා. 'පෙයාවජ්ජං'. ඊළඟට අර්ථචර්යාව - අත්ථචරියා තවත් කෙනෙක් සාමාන්‍ය අවස්ථානුකූලව දීමනාව පමණක් නොවේ ප්‍රිය වචනය පමණක් නොවේ ඊටත් වඩා තමන්ගේ දියුණුව සැලසෙන උපදෙස් බලාපොරොත්තු වෙනවා. දැන් මේ කාලයේ **'උපදේශනය'** කියලා එකකුත් තියෙන්නේ. උපදේශකයොත් හුඟක් ඉන්නේ. අන්න එහෙම තමන්ගේ ආර්ථික හෝ ආධ්‍යාත්මික දියුණුවට උපදෙස් දීම. අර්ථචර්යාව. පරාර්ථචර්යාව කියන අදහසයි. ඊළඟට සමානාත්මතාව කියල කියන්නේ දැන් මේ සමාජයේ නානා විධ කුලභේද පන්තිභේද තියනවා. ඒ නිසාම ඇතැම් අයට මාන්නය නිසා කොන්කිරීම් ආදිය වෙනවා. නමුත් බොහෝ දෙනා බලාපොරොත්තු වෙනවා අවස්ථානුකූලව එකට ඉඳගන්න, එකට ආහාර අනුභව කරන්න, සැපදුක් බෙදා ගන්න, අන්න ඒ විදියෙ සහෝදරත්වය පිළිබඳ හැඟීමක් බොහෝ දෙනා තුළ තිබෙනවා. ඒකට රුකුල් දෙන කෙනා ප්‍රිය මනාප වෙනවා. ඉතින් අවස්ථානුකූලව කළයුත්තක් සමානාත්මතාව කියන්නේ. ඒ ඒ අවස්ථානුකූලව සමානාත්මතාව. භේද අමතක කරලා යම්කිසි උපේක්ෂාවක් හිතේ ඇතිකරගෙන ඒ අය පිළිබඳව මානව සහෝදරත්වය සිහිපත් කරගෙන අවස්ථානුකූලව එක සමානව සැළකීම.

ඉතින් මෙන්න මේ කාරණා ප්‍රකාශ කිරීමේදී බුදුරජාණන් වහන්සේ මෙතන මව්පියන් ගැන සඳහන් කිරීම ඉතාම වැදගත් වෙනවා. මොකද, අපි කවුරුත් අහල තියෙනවා ධර්මයේ මව්පියන් හඳුන්වලා තියෙන්නේ 'බ්‍රහ්මාති මාතා පිතරෝ' ආදී වශයෙන්. බ්‍රහ්මයින් හැටියට හඳුන්වලා තියෙන්නේ සතර බ්‍රහ්ම විහරණය පුරුදුකරන අය හැටියටයි. අපට වැඩිය පුරුදු මව්පියන් දරුවන් පිළිබඳව සතර බ්‍රහ්ම විහරණය වඩන අය හැටියට සැළකීමටයි. නමුත් මෙතන ප්‍රකාශ කරනවා මේ කියාපු දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව, කියන ධර්ම යම්කිසි මවක් හෝ පියෙක් හෝ

පුරුදු කරන්නේ නැත්නම් ඒ අයට දරුවන්ගේ ගරු බුහුමන් ලැබෙන්නේ නැත කියලා. ඒකෙන් අපට හිතා ගන්න පුළුවන් මේ කියන ධර්ම හතරට යටින් තිබෙන්නේ, ආකල්පයක් වශයෙන් තිබෙන්නේ මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා කියන ගුණයි. කෙලින්ම මෙතන සඳහන් නූනත්. කොටින්ම කියතොත් ඒ **සතර බ්‍රහ්ම විහරණයේ ප්‍රතිරාවයක් නැඟෙනවා මේ කියාපු දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව තුළින්.**

ඒක අපි තේරුම් ගන්න උත්සාහ කරමු. දන් මවක් හෝ පියෙක්, විශේෂයෙන්ම මවක් දරුවකු මෙලොවට බිහිවුනාට පස්සේ කරන ටික හිතලා බැලුවොත් ඒ දානය ඇරඹෙන්නේ අර කවුරුත් දන්නවා ලේ කිරිකරලා පොවනවා කියලා. ඒ මව්කිරි දීමෙන්ම ඇරඹෙන දානය දරුවා වෙනුවෙන්. ඊළඟට මවත් පියාත් තමන්ගේ කාලය, ධනය, ශ්‍රමය වැය කරමින්, සෙනෙහස ඒ පැත්තට යොමු කරමින්, දරුවකු ඇතිදැඩි කරනහැටි. ඒ ටික තමයි ධර්මයේ සඳහන් වන්නේ මව්පියන් පිළිබඳව බුද්ධ වචනය වශයෙන්. 'ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරො' මව්පියන් තමාව ඇති කළා. දැඩි කළා. මේ ලෝකය පෙන්නුම් කළා. හඳුන්වා දුන්නා. ඔය විදියට දරුවකු ඇතිදැඩි කිරීම සඳහා කාලය, ධනය, ශ්‍රමය ආදියෙන් මව්පියන් කරන පරිත්‍යාගයයි, දානය හැටියට බැලුවොත්. ඊළඟට ප්‍රිය වචනය. මේ කවුරුත් දන්නවා මව්පියන් දරුවන් කෙරෙහි තියන ස්නේහය නිසා දන් ඔය දරු නැලවිලි ආදිය බලනකොට කොයි තරම් සෙනෙහසකින්ද අඬන දරුවකු පරක් කරන්නේ.

තව ටිකක් වැඩුනට පස්සේ සමහර විට දඟකාර අවධියේදී මවක් පාවිච්චි කරනවා සමහර විට දැඩි වචන. නමුත් කරුණාවෙන් ඒවා පාවිච්චි කරන හැටියටයි අපි කල්පනා කරන්න ඕනෙ.ඒ ස්නේහයම එතන කරුණාවට හැරෙනවා. ඒ කරුණාන්විත වචනය බැලූ බැල්මට දැඩි වුනත් ඒක ඇතුළේ තියෙන්නේ අර දරුවාගේ ආරක්ෂාව සැලසීම. ඒක නිසා ඒ කරුණාව අන්න අර ප්‍රිය

වචනය, ප්‍රිය වචනය සාමාන්‍යයෙන් අප හිතන ප්‍රිය ස්වරූපය පමණක් නොවේ. අවස්ථානුකූලව දැඩි වචනය පවා ප්‍රියවචනයක් වෙනවා. ඒ දරුවාගේ ශුභ සිද්ධිය තකා යෙදූ නිසා අවස්ථානුකූලව. ඉතින් ඒ අතින් **මව්පියන් කුඩා අවධියේදී කරන දරු නැලවිල්ල පමණක් නොවේ දහකාර අවධියේදී හික්මවීම සඳහාත් යොදන වචනය අප සළකන්ට ඕනෑ ප්‍රියවචනය හැටියට.**

ඊළඟට අර්ථචර්යාව කියලා කියන්නේ මව්පියන් දරුවන්ගේ යහපත තකා කවුරුත් දන්නවා ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම් හොඳ නරක කියාදීම්. ඒකයි අර 'පුබ්බාචරියාති වුච්චරෙ' පූර්වාචාර්යයන් වහන්සේලා කියලා කියන්නේ. ඒ විධියට ඊළඟට දරුවන් සමාජයේ නැගී සිටිය හැකි තත්ත්වයකට, ස්වශක්තියෙන් නැඟී සිටිය හැකි තත්ත්වයකට, මව්පියන් පුදුම අන්දමේ පිහිටක් දරුවන්ට ලබාදෙනවා. අන්න අර්ථචර්යාව. හිත වැඩ කැමති වීම.

ඒ වගේම අවසාන වශයෙන් තියෙන සමානාත්මතාව සමහර විට තේරුම් ගන්න අපහසු වෙන්න පුළුවන්. දැන් අපි සමාන්තර වශයෙන් දක්වුවොත් දානය කියන එකට මෛත්‍රිය, ප්‍රියවචනයට කරුණාව, අර්ථචර්යාවට එතකොට මුදිතාව, අපට සම්බන්ධ කරන්න තියෙන්නේ. අර්ථචර්යාව- දරුවකුගේ හැදීම වැඩීම පිළිබඳව මුදිතාවක් ලොකු සතුටක් මව්පියන්ට තියෙනවා. අසල්වාසීන්ගේ හැදීම වැඩීම ගැන සමහර විට ඊර්ෂ්‍යාව තිබුණත් තමන්ගේ දරුවන් ගැන මුදිතාවක් තියෙනවා. සතුටුවීමක් තියෙනවා. 'අනේ හොඳයි, ඒ අයට හරියනවා නම් හොඳයි' කියලා. ඔන්න ඊළඟට සමානාත්මතාව කියල තියෙන්නේ අපට ඒකට එකතු කරන්න තියෙන්නේ උපේක්ෂාව. කොහොමද උපේක්ෂාව මතුවන්නේ? අපට හිතාගන්න පුළුවන් දැන් සාමාන්‍යයෙන් දරුවන් වැඩිහිටි තත්ත්වයට පත්වුනාට පස්සේ මව්පියන් තමන්ගේ දායාදය පවරාදීම. ඒ වගේම වගකීම. ආයතනයක් නම් ආයතනවල අයිතිකරුවෝ 'පුත්‍රයෝ' කියල දාන අවස්ථාවක් තියෙනවා. ඒ වගේම නොයෙකුත් විධියේ තමන්ගේ වතුපිටි ආදිය බෙදාහදා ගන්නවා. ඒ වගේම තවදුරටත්

හිතනවා නම් සාමාන්‍යයෙන් දරුවන් මව්පියන්ට කරන ඇප උපස්ථානයම දරුවන් රෝගී වූ බැරිවූ අවස්ථාවක මව්පියන් උපේක්ෂාවෙන් යුතුව සමානාත්මතාවෙන් යුතුව ඒ කටයුතුත් දරුවන් වෙනුවෙන් කරනවා. අන්න ඒකයි සමානාත්මතාව අවස්ථානුකූලව කළයුතු දෙයක්. ඒ අනුව අපට හිතාගන්න පුළුවන් අර සතර බ්‍රහ්ම විහරණයත් මේ කියාපු සතර සංග්‍රහ වස්තු යට තියනවා කියලා.

ඒ කිව්වේ අර පවුලේ සම්බන්ධතාව පිළිබඳවයි. නමුත් අපි දන්නවා දැන් සිඟාලෝවාද ආදී සූත්‍රවල කියවෙනවා උතුරු දිශාව වන මිත්‍රයින් ඔවුනොවුන්ට සත්කාර කරන්නේ ඔය කියාපු සතර සංග්‍රහ වස්තු වලින් බව. දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව කියන කාරණා වලින්. අර හය දිශාවක් ගැන කියන තැන සිඟාලෝවාද සූත්‍රයේ තමන්ගේ හිත මිතුරන් තමයි උතුරු දිශාව. ඒ උතුරු දිශාවට නමස්කාර කරනවා වගේ ඒ උතුරු දිශාවට පිහිට වෙන්නේ ඔන්න සතර සංග්‍රහ වස්තු වලින්.

ඊළඟට සමාජයට කෙලින්ම බලපාන ආකාරය බුදුරජාණන් වහන්සේ පිරිසිදුව දක්වලා තියෙනවා එක තැනක. දැන් 'එතදග්ග වග්ගය' කියලා ධර්මයේ සඳහන් වෙනවා කොටසක්. ගිහි පැවිදි ශ්‍රාවකයින්ගේ විශේෂ ශක්තීන් හැකියාවන් අනුව 'එතදග්ග' තනතුර දෙනවා. මේ මේ අංශයෙන් මොහු ප්‍රධානයි කියලා. එබඳු තැනක සඳහන් වෙනවා. සතර සංග්‍රහ වස්තූන්ගෙන් පිරිසකට සංග්‍රහ කරන මගේ ශ්‍රාවක උපාසකයින් අතර හත්ථක ආලවක අග්‍රයි කියලා බුදුරජාණන් වහන්සේ වදාරනවා. ඒ වගේම එක සිද්ධියකුත් සඳහන් වෙනවා ධර්මයේ. ඔන්න එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ අලව්නුවර අග්ගාලව චෛත්‍යයේ වැඩ ඉන්න වෙලාවක හත්ථක ආලවක උපාසකතුමා,-හත්ථක ආලවක කියන්නේ අනාගාමී උපාසක තුමෙක්, බුද්ධකාලයේ සිටි ශ්‍රේෂ්ඨ උපාසකයෙක්, මාර්ගඵල අවබෝධ කළ අනාගාමී තත්ත්වයට පැමිණි කෙනෙක්-හත්ථක ආලවක උපාසකතුමා එනවා පන්සියයක පිරිසක් එක්ක බුදුරජාණන්

වහන්සේ දකින්න. ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට වැඳලා එකත්පසක හිඳගත්තාම බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. 'ආලවක ඔබේ පිරිස බොහොම විශාලයි නෙ. කොහොමද ඔය තරම් විශාල පිරිසකට සංග්‍රහ කරන්නේ?' ඔන්න ඉතින් හත්ථක ආලවක උපාසකතුමා කියනවා 'ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ යම් සතර සංග්‍රහ වස්තුවක් ප්‍රකාශ කරලා තියනවා නම්- සංග්‍රහවස්තු හතරක් - අන්න ඒ සංග්‍රහ වස්තුන්ගෙනුයි මම මේ පිරිසට සංග්‍රහ කරන්නේ. මේ පිරිසෙන් යම් කෙනෙකුට දානය අවශ්‍ය නම්, දියයුත්තක් අවශ්‍ය නම්- (අපි හිතමු සමහර විට රැකීරක්ෂා ආදිය පිළිබඳ, ගොවිතැනට අවශ්‍ය උපකරණ හෝ වේවා, මිල මුදල් හෝ වේවා, අවශ්‍යතාවන් අනුව යම් යම් දේ දීම)- ඒ දානය බලාපොරොත්තු වෙන කෙනාට මම දානය දෙනවා. ඒ වගේම ඇතැම් කෙනෙක් ප්‍රියවචනය බලාපොරොත්තු වෙනවා නම්, ඒක නුවණින් සළකලා ඒ අයට ප්‍රිය වචනයෙන් මම සංග්‍රහ කරනවා. එතකොට පිරිසක් අතර අර විධියට අම්මා තාත්තා ආදී වශයෙන් ප්‍රිය වචනයෙන් කථා කරන කොට ඒ අයගෙ හිත මෘදු වෙනවා. මුදු මොළොක් බව. ඒක ඉතින් අවංකවම කළයුත්තක්.

ඊළඟට දක්වනවා යම් කෙනෙකු බලාපොරොත්තු වෙනවා නම් ඒ අයගේ දියුණුව පිළිබඳ උපදෙස්. ඒකත් මම දෙනවා. අර්ථචර්යාව. ඒ වගේම අවස්ථානුකූලව මම සමානාත්මතාව-එකට ඉඳගෙන ආහාර ගැනීම ඒ විධියේ යම් යම් අවස්ථාවල සමානාත්මතාව තුළිනුත් මම සංග්‍රහ කරනවා. එතකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'සාධු! සාධු! බොහොම හොඳයි ආලවක. ඔය විධියට තමයි අතීතයේත් යම් කෙනෙක් පිරිසකට සංග්‍රහ කළා නම් ඔන්න ඔය සංග්‍රහ වස්තු වලින්මයි. අනාගතයේත් යම් කෙනෙක් පිරිසකට සංග්‍රහ කරනවා නම් ඒත් ඔය සතර සංග්‍රහ වස්තු වලින්මයි. වර්තමානයේත් ඔය සතර සංග්‍රහ වස්තුවෙනුයි පිරිසකට සංග්‍රහ කළ යුත්තේ.'ඒ හත්ථක ආලවක උපාසකතුමා පිරිසත් එක්ක නැගිටලා ගියාට පස්සේ බුදුරජාණන් වහන්සේ විශේෂ

ප්‍රශංසාත්මක වාක්‍යයක් ප්‍රකාශ කරනවා සංඝයා වහන්සේලාට, 'මහණෙනි මේ හත්ථක ආලවක උපාසක තැන ආශ්චර්ය අද්භූත ධර්මයන් අටකින් සමන්විත කෙනෙක් හැටියට හිතාගන්න කියල. මොනවද අට? එයින් හතක් මේ කවුරුත් දන්නවා. ආර්ය ධන හැටියට දක්වන. සද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා, සද්ධා, සීල, කවුරුත් දන්නවා. 'හිරි' කියන්නෙ පවට ලැජ්ජාව, 'ඔත්තප්ප' කියන්නේ පවට බය. පාපයට භය. ඊළඟට 'සුත' - බහුශ්‍රැත බව හත්ථක ආලවක බහුශ්‍රැතයි. ඊළඟට 'චාග' පරිත්‍යාගශීලියි. ඊළඟට 'පඤ්ඤා' - ප්‍රඥාව. ආර්‍ය පුද්ගලයෙක් නිසා ප්‍රඥාව තියෙනවා. අවසාන වශයෙන් දක්වනවා අල්පේච්ඡයි. හත්ථක ආලවක අල්පේච්ඡයි. අල්පේච්ඡතාවට සම්බන්ධයි අර සමානාත්මතාවත්. ඒ අවස්ථාවේ තමන්ගේ ලොකුකම අමතක කරලා අවස්ථානුකූලව සමානාත්මතාව දක්වනවා. ඉතින් ඔය විධියේ පිරිසකට සංග්‍රහ කිරීම පිළිබඳ ප්‍රවෘත්තිය ධර්මයේ සඳහන් වෙනවා.

ඒ වගේම තවත් වැදගත් ගැඹුරු සූත්‍රයක-ගැඹුරු කියලා කියන්න පුළුවන් එක්තරා ප්‍රමාණයකින්-බුදුරජාණන් වහන්සේ මේ කියන **සතර සංග්‍රහ වස්තුවම නිවනට නැඹුරු කර** දක්වලා තියනවා. ඒ කොහොමද? ඔන්න එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'මහණෙනි ලෝකයේ තිබෙනවා බල හතරක්. මොනවද බල හතර? **පඤ්ඤ බලං, විරිය බලං, අනවජ්ජ බලං, සංගහබලං** කියල. ප්‍රඥා බලය, වීර්ය බලය. අනවජ්ජ බල කියන්නේ නිරවද්‍යතාව ඒකත් ශක්තියක් හැටියට. ඊළඟට සංගහ බලං. එතකොට සංගහ බලං කියල කියන්නේ අර සංග්‍රහ වස්තුමයි. ඔන්න ඊළඟට එක එකක් විග්‍රහ කරනවා. මොකද්ද 'පඤ්ඤ බලං' කියල කියන්නේ? දීර්ඝ විස්තරයක් අපි කෙටි කරල කිව්වොත් එතන තෝරන්නේ බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව හඳුනාගන්නවා මෙන්න මේ මේ දේවල් කුසල්. මේ මේ දේවල් අකුසල් මේ මේ දේවල් සාවද්‍යයි. වැරදි සහිතයි. මේ මේ දේවල් නිර්වද්‍යයි, මේ මේ දේවල් කළු ධර්ම, මේ මේ දේවල් සුදු ධර්ම ඔය විධියට කළු, සුදු

හඳුනා ගන්නවා වගේ, නුවණින් හොඳ නරක හරියට හඳුනා ගන්නවා. ඒක තමයි ප්‍රඥා බලය. ඒක ඉතින් ආර්ය පුද්ගලයෙකුට අවශ්‍යයෙන්ම තියනවා. ඊළඟට විරිය බලං කියන්නේ අන්න ඒ ධර්මයන් හඳුනාගත්තා නම්, හොඳ දේවල් නරක දේවල් වෙන් වෙන්ව හඳුනාගත්තා නම්, ඊළඟට කරන්න තියෙන්නේ මොකක්ද? නරක දේවල් ඉවත් කිරීමත් හොඳ දේවල් ළංකර ගැනීමත්. ඒ සඳහා යොදන වීර්යයයි එතන විරිය බලං කියලා දක්වන්නේ. ඉතින් එතනත් කෙටියෙන් දක්වනවා අපි කවුරුත් අහලා තියන සතර ආකාර සම්‍යක් ප්‍රධානය. අර නුවණින් දක්ක අකුසල්, වැරදි සහිත දේවල්, කළු ධර්ම, දුරු කිරීම සඳහා අර නිතර වගේ දකින්ට ලැබෙන පාඨය 'ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පගණ්හාති පදහති' ආදි වශයෙන් දක්වනවා. ඒ සඳහා ඕනෑකමක් ඇතිකර ගන්නවා. වෑයමක් දරනවා. වීර්යයක් අරඹනවා. සිත දැඩිව පිහිටුවා ගන්නවා. උත්කෘෂ්ට ප්‍රයත්නයක් දරනවා. ඔය විධියට නරක දේවල්, අකුසල් දේවල්, ඉවත් කිරීම සඳහා දැඩි ප්‍රයත්නයක් දරනවා. ඒ වගේම හොඳ දේවල්, කුශල ධර්මයන්ගේ ප්‍රතිලාභය සඳහා, ලබා ගැනීම සඳහා ඒ වගේම වීර්යයක් දරනවා. ඕකයි වීර්ය බලය. ඒකත් බලයක්, ශක්තියක්. බලපුළුවන්කාර කමක්. නරක දේවල් පන්නන්නත්, හොඳ දේවල් ළංකර ගන්නත්. ඒක වීර්ය බලයක් හැටියට දක්වනවා. ඊළඟට 'අනවජ්ජ බලං'. ඒක කෙටියෙන් නිරවද්‍යතාව දක්වන්නේ. යම්කිසි පුද්ගලයකුට නිවැරදි කාය වාග් මනෝ කර්මයන් තියෙනවා. අන්න අර කියාපු ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් හැටියට ඒ තැනැත්තාට තමන්ගේ කය වචනය සිත පිළිබඳ ක්‍රියාකාරීත්වය හරියාකාරව පවත්වා ගන්න පුලුවන්. එතකොට අනවජ්ජ බලය කියලා කියන්නේ නිවැරදි ජීවිතය, නිවැරදි ජීවිතය පිළිබඳ ශක්තිය. සිත, කය, වචනය හරිමාර්ගයේ යෙදවීම.

ඔන්න ඊළඟට තියෙනවා **'සංගහ බලං'** ඒක ටිකක් අමුතු විධියකටයි එතන විග්‍රහ කරන්නේ. සංගහ බලය කියන්නේ, ඒකෙන් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ, අර සතර සංග්‍රහ වස්තුමයි.

නමුත් ඔන්න විවරණය දෙන්නේ අමුතු විධියකට. එතනදී බුදුරජාණන් වහන්සේ උත්කෘෂ්ටම අර්ථයෙන් ඒ හතර දක්වන්නේ. **'එතදග්ගං භික්ඛවෙ දානානං යදිදං ධම්මදානං'** මහණෙනි දානයන් අතුරෙන් මේකයි අග්‍ර. එනම් ධර්ම දානය. ඊළඟට ප්‍රියවචනය පිළිබඳව දක්වනවා.**'එතදග්ගං භික්ඛවෙ පෙය්‍යවජ්ජානං යදිදං අත්ථිකස්ස ඔහිතසොතස්ස පුනප්පුනං ධම්මං දෙසෙති'**. මොකක්ද ප්‍රියවචනය කියලා කියන්නේ. අපි හිතන මිහිරි වචනයම නොවෙයි. 'අම්මා' 'තාත්තා' කියන එක නොවේ. මෙතන ඊට වඩා ගැඹුරින් දක්වනවා. 'අත්ථිකස්ස ඔහිතසොතස්ස' කියල කියන්නේ ධර්මය අසනු කැමති කන් නමාගෙන සිටින අයට 'පුනප්පුනං' නැවත නැවත ධර්මය දේශනා කිරීම තමයි මෙතැන ප්‍රිය වචනය හැටියට දක්වලා තියෙන්නේ. මොකද ඒ? **මොකද ඒ?** ධර්මය තරම් රස දෙයක් නැහැ කවුරුත් දන්නවා නේ. කවුරුත් කියලා කියන්න බැහැ. ධර්මය හරියට හඳුනා ගත්තු අය දන්නවා. ධර්මය තරම් රසවත් දෙයක් නැහැ. ඒක තමයි කියන්නේ 'සබ්බදානං ධම්මදානං ජිනාති - **සබ්බං රසං ධම්ම රසො ජිනාති'** ධර්ම රසය හැම රසයම පරදනවා. ඒ වගේම කණට ඒ තරම් රසායන දෙයක් නැතෙයි කියල කියනවා. ඒක නිසා තමයි අන්න **නියම ප්‍රියවචනය කියන්නේ. ධර්මය අසනු කැමැත්තන්ට නැවත නැවත ධර්මය දේශනා කිරීම.** ඒකයි ප්‍රියවචනයෙන් සංග්‍රහ කිරීම.

ඔන්න ඊළඟට අර්ථ චර්යාව. ඒකත් අමුතු විධියටයි දක්වන්නේ. මොකක්ද අර්ථ චර්යාව? ව්‍යාපාර දියුණු කරගන්න දෙන උපදෙස් නොවෙයි. ඒ උපදේශනය නොවෙයි. මෙතන දක්වන්නේ ශ්‍රද්ධාව නැති පුද්ගලයාව ශ්‍රද්ධාවේ පිහිටුවනවා, ශ්‍රද්ධාවේ සමාදන් කරවනවා. 'නිවෙසෙති පතිට්ඨපෙති' කියන වචන යෙදෙනවා. ශ්‍රද්ධාව නැති පුද්ගලයකු තුළ ශ්‍රද්ධාව ඇති කරනවා. ඒ සඳහා විශේෂ උත්සාහයක් යොදනවා. ශ්‍රද්ධාවේ පිහිටුවනවා තුනුරුවන් කෙරෙහි. ඊළඟට සීලය නැති තැනැත්තා, දුශ්ශීල පුද්ගලයා සීලයෙහි පිහිටුවනවා. ඒකයි අර්ථචර්යාව. ඊළඟට මසුරු පුද්ගලයා ත්‍යාග ගුණයෙහි

පිහිටුවනවා. පරිත්‍යාගය පැත්තට යොමුකරනවා ඒ පුද්ගලයාව. ඊළඟට ප්‍රඥාව නැති පුද්ගලයා ප්‍රඥාවේ පිහිටුවනවා. ඔන්න එතකොට එතන අපට පේනවා අර්ථචර්යාව කියන එක ලෝකෝත්තර මට්ටමින් දක්වූ බව, නිවනට උපකාරවන අන්දමින්. ඒකටම ගැලපෙන අන්දමින් ඊළඟට සමානාත්මතාව දක්වන්නේ කොහොමද? අමුතු විදියකට එතැනත් පෙන්නුම් කරන්නේ. සෝවාන් පුද්ගලයා සෝවාන් පුද්ගලයාට සමානයි. සකදාගාමී පුද්ගලයා සකදාගාමී පුද්ගලයාට සමානයි. අනාගාමී පුද්ගලයා අනාගාමී පුද්ගලයාට සමානයි. අර්හත් පුද්ගලයා අර්හත් කෙනාට සමානයි. කොහොමද අපි මේක තේරුම්ගන්නේ? මාර්ගඵල මට්ටමට ගත්තට පස්සේ අන්ත දුගියෙක් හෝ වේවා, මහා පණ්ඩිතයෙක්, කුලීනයෙක්, රජකෙනෙක් හෝ වේවා සෝවාන් තත්ත්වයට පැමිණියානම් සෝවාන් බවින් සමානයි. සකදාගාමී තත්ත්වයට පැමිණියා නම් සකදාගාමී බවින් සමානයි. ඕක අනුව තමයි අපට හිතාගන්න තියෙන්නේ. දැන් බුදුරජාණන් වහන්සේගේ ශාසනය තුළ කුලභේදයක් නැතිබව අපි කවුරුත් දන්නවා. ඒක නිසාමයි ඕනෑම කුලයකින් මහණ වුනත් 'ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර' කියලා කියනවා. ශාක්‍යපුත්‍රිය ශ්‍රමණ තත්ත්වයට පත්වෙනවා. ඒවගේ මෙතනත් අන්න අර මාර්ග ඵල අනුවයි සමානාත්මතාව මෙතන දක්වලා තිබෙන්නේ, ගැඹුරු අර්ථයකින්. ඉතින් ඔන්න ඔය විධියට බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා **මේ සතර සංග්‍රහ වස්තුම නිවන්කරා යන තාක් කෙනෙකුට උපකාර වෙන බව.**

ඊළඟට මේකටම අපට සම්බන්ධ කරන්න පුළුවන් තවත් වටිනා සූත්‍ර තිබෙනවා. දැන් මේක ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් සතර බ්‍රහ්ම විහරණයෙන් පටන් ගෙන ඒක ආකල්ප වශයෙන් ඇතිව මේ කරන සමාජ සංග්‍රහය එදිනෙදා ජීවිතය යහමඟට ගැනීමට උපකාර වනවා පමණක් නොවේ නිවනට නැඹුරු වන්නත් උපකාර වන බව මේ සතර සංග්‍රහ වස්තු විග්‍රහයෙන් පෙනෙනවා.

මේ කාලයේ අපි කවුරුත් දන්නවා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජනප්‍රිය වීගෙන යන විෂයයක් තමයි **'උපදේශනය'** කියන එක. ඉතින් ඒ කොයි කොයි විධියේ පාඨමාලා ඔස්සේ උපදේශනය වෙනවාද කියන එක අපි දන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කරන සතර සංග්‍රහ වස්තුත් ඒක යට තියන සතර බ්‍රහ්ම විහරණත් ගැන කල්පනා කර බලන කොට ඒවා නියම උපදේශකයෙක් වෙන්න, නියම උපදේශනය මොකක්ද කියලා හඳුනාගන්න උපකාර වෙනවා. මොකද, අර ඇතුළතින්ම කෙනෙකුට නැත්නම් කෙනෙකුගේ යහපත පිළිබඳව යෙදීමට ඇති ඕනෑකම, එහෙම නැත්නම් මෛත්‍රිය කරුණා මුදිතා උපේක්ෂා, - ඒකම තමයි ඔය කවුරුත් දන්නවා කරණීය සූත්‍රයේ සඳහන් වෙනවා මෛත්‍රිය ගැන ප්‍රකාශ කරන තැන **'මාතා යථා නියං පුත්තං - ආයුසා එක පුත්තමනුරක්ඛෙ - එවම්පි සබ්බභූතෙසු - මානසං භාවයෙ අපරිමාණං'** එතකොට මවක් යම්සේ තමාගේ එකම පුත්‍රයා ජීවිතය පරිත්‍යාග කිරීමෙන් හෝ රැකගන්නවා වගේ එහෙම නැත්නම් ඒ පමණටම මවක් තුළ දරුවකුට තියන මෛත්‍රිය වගේ, 'අපරිමාණං' අප්‍රමාණ වශයෙන් ලෝකයාට ඒක විහිදුවන්න කියලා. ඒක ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන් මෛත්‍රිය වගේම කරුණාව මුදිතාව උපේක්ෂාව ඒ හැම එකක්ම 'අප්පමඤ්ඤා' කියලා දක්වනවා. අප්‍රමාණ වශයෙන් විහිදුවීමෙන් තමයි අන්න මුළු සමාජයම ඒකට අහුවෙන්නේ, සමාජයම නතු කරගන්න පුළුවන් වන්නේ. සමාජය කියලා කියන්නේ දන් මෙතන මේ පිරිසක් කියලා කියපු ඒකයි. නමුත් දැන් තියන නොයෙකුත් සමාජ ධර්ම වලට වඩා වෙනස් වන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ ඔය විදියෙ දෙයක්.

ඒ වගේම දැන් අපි සාමාන්‍යයෙන් ලෝකයේ සමහර දේවල් ආත්මාර්ථකාමී කියලා සළකනවා. දන් මෙතන මේ කියවෙන්නේ පරාර්ථචර්යාව. ඇත්ත වශයෙන්ම දක්වනවා බුදුරජාණන් වහන්සේ අනිත් තැන්වල දක්වන මැදුම් මඟ වගේ මේ ධර්මයේත් තියනවා **'අත්තහිත පරහිත'** කියලා ඒ දෙපැත්තම. තමාගේ යහපතත්

අනුන්ගේ යහපතත්. දැන් කුසලාකුසල විග්‍රහය පිළිබඳවත් බුදුරජාණන් වහන්සේ දක්වලා තිබෙන්නේ යමක් අකුසල් වෙන්නේ මොකද, ඒක තමාගේ පරිහානියටත් හේතු වෙනවා, අනුන්ගේ පරිහානියටත් හේතු වෙනවා. දෙපක්ෂයේම පරිහානියට හේතු වෙනවා. ඒව තමයි අකුසල් කියලා කියන්නේ. ලෝභ, දෝස, මෝහ ආදී වශයෙන් ඇතිවන දේවල්. අනිත් අතින් බලන විට දෙපැත්තේම යහපත සැලසෙන දේවල් තමයි කුසල් කියලා කියන්නේ. බුදුරජාණන් වහන්සේ ඒ ප්‍රකාශය කෙලින්ම සංඝයා වහන්සේ කෙනෙකුට ප්‍රකාශ කළ තැනක් සඳහන් වෙනවා. සංඝයා වහන්සේ නමක්, නම සඳහන් වන්නේ නැහැ කවුද කියලා, ඇවිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් අහනවා "භාග්‍යවතුන් වහන්ස කාටද 'පණ්ඩිතො මහාපඤ්ඤො' කියලා කියන්න සුදුසු? කාටද කියන්නේ, " පණ්ඩිතො මහා පඤ්ඤො' කියලා". බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා යම් කෙනෙක් තමාගේ හිංසාව පිණිස තමාගේ පරිහානිය පිණිස නොසිතයිද, අනුන්ගේ පරිහානිය පිණිස නොසිතයිද, ඒ වෙනුවට තමාගේ හිතසුව පිණිසත් අනුන්ගේ හිතසුව පිණිසත්-**'අත්ත හිතං පරහිතං උභයහිතං සබ්බලොක හිතමෙව චින්තෙති'** කියලා සඳහන් වෙනවා එතන වටිනා වාක්‍යයක්. ඇතැම් කෙනෙක් හිතන්න පුළුවන් මේ බෞද්ධයා කියලා කියන්නේ කොන්වෙලා ඉන්න ආත්මාර්ථකාමී කෙනෙක් කියලා. නමුත් අන්න අර විධියට බුදුරජාණන් වහන්සේ දක්වනවා දෙපැත්තම. 'අත්තහිතං පරහිතං උභයහිතං සබ්බලොක හිතමෙව චින්තෙති' **අන්න පණ්ඩිත මහා ප්‍රාඥ පුරුෂයා බුදුරජාණන් වහන්සේ හඳුන්වන හැටි. තමාගේ යහපතත්, අනුන්ගේ යහපතත්, දෙපක්ෂයේම යහපතත්, මුළු ලෝකයේම යහපතත් හිතන කෙනෙක් හැටියටයි දක්වලා තිබෙන්නේ.**

ඒක වඩාත් ප්‍රකට වන වටිනා සූත්‍රයක් තව තැනක තිබෙනවා. පුද්ගල හතරකට බෙදලා අමුතු විධියේ විග්‍රහයක් දක්වනවා. දැන් ඔය **'හිත' කියලා කියන්නේ යහපත.** ඒ ටික තේරුම් ගත්තා

නම් ඔන්න ඊළඟට කියනවා එක පුද්ගලයෙක් ඉන්නවා ඒ පළමුවැනි පුද්ගලයා තමාගේ යහපත සඳහාවත් අනුන්ගේ යහපත සඳහාවත් වැඩ කරන්නේ නැති කෙනා. **'නෙව අත්තහිතං න පරහිතං'.** එයා බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ මේ විධියටයි. යම්සේ මහණෙනි සොහොනක තියෙනවා නම් අශුචි තැවරුන ගිනි පෙනෙල්ලක්. ගමට ලීකැල්ලක් හැටියට ප්‍රයෝජනයට ගන්නත් බැහැ. කැලේට ලී කැල්ලක් හැටියට ප්‍රයෝජනයට ගන්නත් බැහැ. අන්න ඒ වගේ මම හඳුන්වනවා. අන්න අර කියාපු පුද්ගලයා. අත්තහිතත් නෑ පරහිතත් නෑ. තමාගේ යහපත සළකන්නෙත් නැහැ. අනුන්ගේ යහපත සළකන්නෙත් නැහැ. ගන්නම දෙයක් නැහැ. ඔන්න පළමු වැනි පුද්ගලයා.

ඔන්න ඊළඟට දෙවෙනි පුද්ගලයා. දෙවෙනි පුද්ගලයා කවුද? **'පරහිතාය පටිපන්නො නො අත්තහිතාය'** අනුන්ගේ යහපත සඳහා වැඩ කරනවා. නමුත් තමන්ගේ යහපත ගැන සළකන්නේ නැහැ. ඒක කියලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ඔන්න ඔය දෙන්නා අතුරෙන් ශ්‍රේෂ්ඨයා, විශිෂ්ටයා, හැටියට සළකන්නේ දෙවෙනියා. ඒක හිතා ගන්න පුළුවන් නේ. කොහෙත්ම වැඩක් නැති පුද්ගලයත්, අනුන්ගේ යහපත සළකන තමන්ගේ යහපත සළකන්නේ නැති පුද්ගලයාත්. ඒ දෙන්නාගෙන් දෙවෙනි කෙනා උසස් බව අපට පිළිගන්න පුළුවන්.

ඔන්න ඊළඟට එනවා කෙනෙකුට හිතන්න හොඳ කාරණයක්. තුන්වෙනි පුද්ගලයා කවුද? **අනුන්ගේ යහපත සළකන්නේ නැහැ. තමන්ගේ යහපත සළකනවා.** තමන්ගේ යහපත සඳහා වැඩ කරනවා. ඒක ප්‍රකාශ කරලා බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා **මේ තුන්දෙනාගෙන් විශිෂ්ට පුද්ගලයා දෙවැන්නා නොවේ තුන්වැන්නා.** අන්න ඒක කෙනෙකුට අභියෝගයක් වෙන්න පුළුවන් මේ කාලයේ චින්තනයේ හැටියට. එතකොට දෙවැන්නා කවුද? තමාගේ යහපත සළකන්නේ නැහැ අනුන්ගේ යහපත විතරයි සළකන්නේ. තුන්වැන්නා කවුද? අනුන්ගේ යහපත සළනන්නේ නැහැ.

තමන්ගේ යහපත පමණයි සළකන්නේ. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා මෙයා මේ තුන්දෙනාගෙන් විශිෂ්ටයා හැටියට. ඒක අපි පස්සේ තේරුම් කරන්න බලමු.

ඔන්න ඊළඟට හතර වෙනුව දක්වනවා - ඒකේ නම් අමුතුවෙන් විවාදයක් නැහැ. හතරවෙනි පුද්ගලයා **අනුන්ගේ යහපතත් තමන්ගේ යහපතත් දෙකම සළකනවා. ඒ තැනැත්තා තමයි හතරදෙනාගෙන් විශිෂ්ටයා.** එතකොට මෙතන බුදුරජාණන් වහන්සේ පුදුම විග්‍රහයක් දීල තියෙන්නේ. එක්කෙනෙක් ගැන කෙලින්ම කීවා දෙකක් ආවාට පස්සේ දෙන්නාගෙන් විශිෂ්ටයා. තුනක් ආවාට පස්සේ තුන්දෙනාගෙන් විශිෂ්ටයා. හතරක් ආවාට පස්සේ හතරවෙනියා ශ්‍රේෂ්ඨයි. ඉතින් **මෙතන සමහර විට සැකයක් ඇතිවන්න පුළුවන් ඇයි අර අනුන්ගැන නොසිතා තමන්ගෙ දියුණුව ගැන හිතන කෙනාට විශිෂ්ට තත්ත්වය දුන්නෙ කියලා. ඒක තේරුම් ගන්න උපකාරවන ගාථාවක් තියෙනවා ධම්මපදයේ.**

අත්තදත්ථං පරත්ථෙන
බහුනාපි න හාපයෙ
අත්තදත්ථමභිඤ්ඤය
සදත්ථපසුතො සියා

ඒ කියන්නේ බොහෝ වූ පරාර්ථය සඳහාවත් තමාගේ අර්ථය, තමන්ගේ දියුණුව, මේ දීර්ඝ සංසාරයේ තමන්ගේ ආධ්‍යාත්මික දියුණුව, කැප කරන්න එපා කියලා. '**අත්තදත්ථං පරත්ථෙන - බහුනාපි න හාපයෙ** බොහෝ පරාර්ථය සඳහාවත් තමාගේ- තමාට තමා පමණයි ඉන්නේ- තමාගේ හිතසුව විනාශ කරගන්න එපා. '**අත්තදත්ථමභිඤ්ඤාය** - සදත්ථපසුතො **සියා**' තමන්ගේ අර්ථය යහපත හරියාකාරව තේරුම්ගෙන ඒකෙහි යෙදෙන්න කියලා. මොකද මේ කියන්නේ? තමා මඩගොඩේ ඉඳගෙන කොහොමද කෙනෙක් මඩගොඩෙන් ගන්නේ? තමා නරක ප්‍රතිපත්ති වල-දන්

අපි හිතමු අනෙක් අයට උපකාර වෙන්නයි කියලා අපි පස්පවම කරනවා. සමාජයට උපකාර වෙන්න කියලා අපි ප්‍රාණඝාතය කරනවා, හොරකම් කරනවා, බොරු කියනවා, අනෙකුත් පව්කම් කරනවා. සමාජයට උපකාර වෙන්න. නමුත් අන්තිමට නරක ආදර්ශයක් නිසා සමාජයත් පිරිහෙනවා. ආධ්‍යාත්මික අතින්. තමනුත් ඒ එක්කම පිරිහෙනවා. නමුත් පිටට පේන්නේ පරාර්ථය හැටියට. අන්න ඒක නිසා **පරාර්ථයට නියම පදනම ආත්මාර්ථයමයි. ආත්මාර්ථය කියලා කීවේ අර විධියේ පටු අදහසක් නොවෙයි. ඇතුළත ආධ්‍යාත්මික දියුණුවක්.** එහෙමයි අපට හිතාගන්න තියෙන්නේ. එතකොට අර 'අත්තදත්ථං පරත්ථෙන' කියන ගාථාව ධම්මපදයේ දැකලා කෙනෙක් ප්‍රශ්නයක් නගන්නත් පුළුවන්. ඇයි බුදුරජාණන් වහන්සේ හරි ආත්මාර්ථකාමීත්වයක් ගැන නේ දේශනා කරලා තියෙන්නේ කියලා. මේක ආශ්‍රයෙන් තේරුම් ගන්න ඕනැ, ඒ කියන්නේ තමන්ගේ අර ආධ්‍යාත්මික ප්‍රගතිය ගැන අමතක කරලා ලෝකාර්ථය සඳහාය කියලා පව්කම් කිරීම. දැන් මොකද බුදුරජාණන් වහන්සේම ප්‍රකාශ කළා නේ කුසල් අකුසල් විග්‍රහය අනුව **දෙපක්ෂයටම වැඩදායක දේ පමණයි කුසල්**. එක පක්ෂයකට පමණක් නොවේ. ඒක හරියට තේරුම් ගත්තාට පස්සේ අන්න බුදුරජාණන් වහන්සේ පණ්ඩිත මහා ප්‍රාඥ පුද්ගලයා ගැන කළ විග්‍රහයෙන් පෙනෙනවා නියම ඉලක්කය. ඒකමයි බුදුකෙනෙක් කරන්නෙ - නියම ඉලක්කය නම් අත්තහිත පරහිත දෙකම ඒ ඒ මට්ටමින්.

ඒ කොයි මට්ටමින් කළත් ඒක ධර්මානුකූල වෙන්න ඕනැ. ධර්මානුකූල වෙන්න නම් අන්න අර කියාපු බල හතර ගැන අපි හිතන්න ඕනැ. 'පඤ්ඤා බලං' කීවේ මොකද? දැන් යම් කෙනෙකුට සමාජ සේවයක් කරන්න ඕනැ නම් මොකක් හරි බලපුළුවන්කාර කමක් තිබෙන්න එපායැ. දැන් අපි හිතන්නේ බොහෝ දෙනාට සමාජ සේවයක් කරන්න බලපුළුවන්කාරකමක් තියෙන්න ඕනැ. මෙන්න ධර්මානුකූලව බලපුළුවන්කාරකම. ප්‍රඥාව තියෙන්න ඕනැ,

හොඳ නරක වටහා ගැනීමට, කුසල් අකුසල් වටහා ගැනීමට, යුතු අයුතුකම් වටහාගැනීමට, කළයුතු නොකළ යුතුදේ වටහා ගැනීමට. ඒ බලය උපකාරකරගෙන, ඒ බලපුළුවන්කරකම උපකාර කරගෙන තමයි ප්‍රශ්නයක් ආවාම 'උපදේශනය' කරන්නේ. උපදේශකයාට අයිති දෙයක් ඒ ප්‍රඥා බලය. ඊළඟට 'විරිය බලං'. ඒ උපදේශකයා අර නරක දේ ඉවත් කරන්න කොහෙත්ම උනන්දුවක් නැත්නම්, වීර්යයක් දරන්නෙ නැත්නම්, හොඳ දේ ළංකර ගන්න වීර්යයක් දරන්නේ නැත්නම්, එයා කරන උපදේශනය, මොකක්ද? අර විරිය බලය නැති ඒ කුසීතයා, ඒ විධියේ කුසීත පුද්ගලයාට සංග්‍රහයක් කරන්න බැහැ. පරාර්ථචර්යාවේ යෙදෙන්න බැහැ. ඊළඟට ඒ වගේම තමයි 'අනවජ්ජ බලං' නිරවද්‍ය ක්‍රියා මාර්ගයක් ඇති තැනැත්තා තමයි ඒකට සුදුසු. තමන්ගේ චරිත ස්වභාවය අර විධියට නොමගට යනවා නම් ඒ තැනැත්තාට බැහැ නියම සේවයක් කරන්න. ඊළඟට ඒ වගේම තමයි අර "සංගහ බලං" කියන එකේ කිට්ටුවටවත් එන්න බැහැ ධර්මානුකූලව.

ඒ එක්කම එම සූත්‍රයේම සඳහන් වෙනවා ඔන්න ඔය කියාපු බල හතර ඇති ආර්ය ශ්‍රාවකයා, මොනවද බල හතර, පඤ්ඤා බලං, විරිය බලං, අනවජ්ජ බලං, සංගහ බලං කියන බල හතර ඇති පුද්ගලයා කල්පනා කරන ආකාරය බුදුරජාණන් වහන්සේ දක්වනවා, එබඳු ඒ පුද්ගලයාට භය හතරකින් නිදහස් වෙන්න පුළුවන් කියලා. මොනවද භය හතර? භය කියලා අපි පාවිච්චි කරන්නේ අන්තරාය. සාමාන්‍ය කෙනෙක් භය වන දේවල්. මොනවද භය හතර? සාමාන්‍ය සමාජයේ ජීවත්වන පුද්ගලයාට එන භය හතරක් ඔතන තියෙන්නේ, 'ආජීවික භය' ආජීවික භය කියන්නෙ ජීවිකාව පිළිබඳ භය. රක්ෂාව නැතිවෙයි කියන භය, මේ බුදුරජාණන් වහන්සේ කතාකරන්නේ. ඊළඟට දෙවනුව දක්වන භය මොකක්ද? අසිලෝක භයං. සිලෝක කියන්නේ ප්‍රශංසාව. එතකොට ගර්හාව, නින්දාව, ගැරහීම පිළිබඳ භය. ඕකත් තියනවා නෙ සමාජගත පුද්ගලයාට. ඊළඟට තුන්වන භය මොකක්ද? 'පරිස සාරජ්ජ භයං'

පිරිසක් මැදට යන්න භය. මොකද කියල හිතා ගන්න පුළුවන්. පිරිසක් මැදට යන්න භය. ඕකත් භයක් සමාජගත පුද්ගලයාට. සතරවෙනි භය මොකක්ද? මරණ භය. පස්වෙනි භය මොකක්ද දුගති භය. එතකොට ආර්ය පුද්ගලයා ගැන සඳහන් වෙනවා ඒ ආර්ය පුද්ගලයා ඔය පඤ්ච භය සමතික්‍රමණය කරනවා. ඉක්මවනවා කියලා.

වෙනෙකක් තබා ඒ පුද්ගලයා හිතන ආකාරයත් බුදුරජාණන් වහන්සේ දක්වනවා. මෙන්න මෙහෙම හිතනවයි කියලා. 'මට මේ ජීවිකා වෘත්තිය පිළිබඳ භයක් නැහැ. මොකටද මම ජීවිකා වෘත්තිය පිළිබඳ භයක් ඇති කරගන්නේ? මට තියෙනවා ප්‍රඥා බලය, මට තියෙනවා විරිය බලය. මට තියෙනවා අනවජ්ජ බලය, මට තියෙනවා සංග්‍රහ බලය, 'අර පුද්ගලයා හිතන ආකාරයට කියන්නෙ,' ප්‍රඥාව නැති කෙනයි ජීවිකාව පිළිබඳ භය, ජීවිකාව නැති වෙයි කියල භය ඇති කරගන්න ඕනෙ. කුසීතයයි ජීවිකාව පිළිබඳ භය ඇති කරගන්න ඕනෙ. වැරදි කාය වාග් කර්ම ඇති කෙනයි ජීවිකාව පිළිබඳ භයක් ඇති කර ගන්න ඕනෙ. පිරිසට සංග්‍රහ නොකරන තැනැත්තයි ජීවිකාව පිළිබඳ භය ඇතිකර ගන්න ඕනෑ.' ඒ වගේම ඊළඟට කියවෙනවා අනික් භය පිළිබඳවත්.' මට නැහැ ගර්හාව, නින්දාව, පිළිබඳ භයක්. මොකටද මම භය වන්නේ ගැරහීම නින්දාව පිළිබඳව. මට තියෙනවා ප්‍රඥා බලය, වීර්ය බලය, අනවජ්ජ බලය, සංග්‍රහ බලය, ප්‍රඥාව නැති කෙනයි ඒ ගැරහීම් පිළිබඳව නින්දාව පිළිබඳව භය වෙන්න ඕනෑ. කුසීතයයි ඒ විධියට භය වන්න ඕනෙ. වැරදි කාය වාග් කර්ම තියන කෙනයි ඒ විධියට ගැරහීමට භය වන්න ඕනෑ. සංග්‍රහ නොකරන කෙනයි ඒ විධියට භය වෙන්න ඕනෑ,' ඒ විධියටම සඳහන් වනවා පිරිසක් මැදට යාම පිළිබඳව. එතනදිත් ඒ පුද්ගලයා කල්පනා කරන ආකාරය. 'මට භයක් නැහැ පිරිසක් මැදට යන්න. මොකද මට තියෙනවා අර කියාපු ප්‍රඥා බලය, වීර්ය බලය, අනවජ්ජ බලය, සංග්‍රහ බලය. එතනදිත් ප්‍රකාශ කරනවා,' ප්‍රඥාව නැති

මිනිහයි පිරිසක් මැදට යන්න භය වෙන්න ඕනෑ. කුසීතයයි ඒ විධියට භය වෙන්න ඕනෑ. වැරදි කාය වාග් කර්ම ඇති කෙනයි භය වෙන්න ඕනෑ. අනිත් අයට සංග්‍රහ නොකරන කෙනයි භයවෙන්න ඕන! ඒ විධියටම සඳහන් වෙනවා. මරණ භය පිළිබඳව. මේ ආශ්‍රයෙන් හිතා ගන්න පුළුවන්. එතනදිත් කියවෙන්නේ මම මොකටද මරණයට භය වෙන්නේ. ප්‍රඥාව නැති මිනිහයි මරණයට භය වෙන්නේ. වීර්ය නැති මිනිහයි. වැරදි ක්‍රියාමාර්ග ඇති කෙනයි සංග්‍රහ නොකරන කෙනයි මරණයට භය වන්නේ. ඊළඟට දුගතිය පිළිබඳවත් ඒ විධියටයි.

ඉතින් මේක ටිකක් සමහර විට පටලැවිල්ලක් වෙන්න පුළුවන්. මේ පින්වතුන්ට හිතාගන්න අමාරු වෙන්න පුළුවන්. මේක තේරුම් ගන්න වෙන්නේ මෙහෙමයි. දැන් අර කියාපු කායවාග් කර්මවල අඩුපාඩුකම් තියෙනවා නම්- ඇත්ත වශයෙන්ම මේ යුගයේ හැටියට 'හොඳ මිනිහට තැනක් නැහැ' කියන කථාවක් තියෙනවා නේ සමාජයේ. කවුරුත් දන්නවා රට යන හැටි. දැන් වැල යන අතට මැස්ස බඳින එකනේ වැඩි. ධර්මය අධර්මය සළකන්නේ නැහැ. වැල යන අතට මැස්ස බඳිනවා. ලේසි වැඩේ. ආත්මාර්ථකාමීව. නමුත් අන්න බුදුරජාණන් වහන්සේ ඒවා පෙන්නුම් කරල දීල තියෙනවා. එබඳු අයට වැඩිකල් ඉන්නත් බැහැ ඒ තත්ත්ව වල. ඉතින් කෙසේ හෝ වේවා. අන්න අර කියාපු සුදුසුකම් නැත්නම්, ආජීවික භය කියල කියන්නේ සමහර විට ලොකු රස්සාවක් ලැබෙයි හිටි ගමන්. මේ කාලයේ තියනවා නේ අල්ලස් දූෂණ ආදී නානාවිධ දේවල්. බොහොම බයෙන් ඉන්නේ කොයි වෙලාවේ මේක අහුවෙලා තමන්ගේ තනතුර නැති වෙලා පාරට බහින්න වෙයිද කියලා. ඒ විධියේ භයක් නැහැ. අන්න අවංක පුද්ගලයට. අර කියාපු ගුණධර්මවල පිහිටපු පුද්ගලයාට භයක් නෑ. එතැන නැති වුනත් වෙන තැනකට යනවා. අමුතු සහතික ඕන නැහැ එබඳු පුද්ගලයාට. විමසලා බලන එක විතරයි අහවලා කොහොම කෙනෙක්ද කියලා. බොහෝ දෙනා අනික් අයගේ සහතික

බලාපොරොත්තු වෙනවා. හොඳ ජීවිතයක් ගෙවන කෙනාට සහතික අවශ්‍ය නැහැ. අර වගෙයි ටිකක් විපරම් කරලා බලනකොට. දැන් එක පැත්තකින් අපි කිව්වා හොඳ මිනිහාට තැනක් නැහැ කියලා සමාජයේ. තව පැත්තකින් ඇහෙනවා සමාජයේ වැඩකට මිනිහෙක් නැහැ කියලා. මෙච්චර ජනගහණයක් හිටියත් වැඩකට මිනිහෙක් නැත්තෙ මොකද? අවංක මිනිහෙක් නැහැ. යන්ත්‍රයක් ගැන විශ්වාසය තියන්න පුළුවන් මේ කාලයේ තියන යන්ත්‍ර ගැන, යකඩ මිනිසුන් ගැන. මනුෂ්‍යයින් ගැන විශ්වාසයක් තියන්න බැරි තරම් ධර්මයෙන් ඉතාමත්ම දීන තත්ත්වයට වැටිලා තියනවා. ඒක නිසා අපට හිතා ගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේගේ වචනය අදටත් සත්‍ය බව. එතකොට ඒ පුද්ගලයාට ජීවිකාව පිළිබඳ භයක් නැත කීවේ ඒකයි. එවැනි පුද්ගලයින්ට සමාජයේ කවදත් තැනක් තියනවා.

එතකොට ඒ වගේම තමයි. අර ගර්හාව නින්දාව පිළිබඳව මේ කාලයේ අහන්න ලැබෙන අල්ලස් දූෂණ ආදිය. හොඳට වැජඹෙන, ඉහළින්ම වැජඹෙන පුද්ගලයින් පිළිබඳව හිටිගමන් ලොකු අකුරින් පළවෙනවා යම්කිසි ප්‍රවෘත්තියක්. ඊට පස්සේ ඒ තැනැත්තා කොහේද කියලා නැහැ. අන්න එතකොට එයින් පේනවා චරිත ශක්තියේ දුර්වලකම නිසාමයි ඒ තැනැත්තාට සභාවක් මැදට යන්න බැරි. 'පරිස සාරජ්ජ භය' කියන්නේ ඒකයි. ඔන්න දැන් හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ අර ආර්ය පුද්ගලයාගේ සිතුම් පැතුම් වචනයට නඟලා ඉදිරිපත් කළේ මොකද කියලා. ලෝකයාට පාඩමක් හැටියට. ඒ පුද්ගලයා හිතනවා භය නැතිව. 'මම භය නෑ ඕවාට. මම මොකටද භය වෙන්නේ' අන්න එහෙම කියන්න පුළුවන් චරිත ශක්තියක් ඒ පුද්ගලයාට ඇතිවෙනවා ආර්ය ශ්‍රාවකයාට. එතකොට ජීවිකාව පිළිබඳ භයක් නැහැ. නින්දා ගර්හාව පිළිබඳ භයක් නැහැ. පිරිස් මැදට යාමට භයක් නැහැ. මරණයට භයක් නැහැ. දුගතියට භයක් නැහැ. ඔන්න ඕකයි අපට හිතාගන්න තියෙන්නේ.

ඒ එක්කම අපි කල්පනා කරලා බලමු. දැන් මේ කියන්නේ සමාජ සේවය ගැන. එහෙම නැත්නම් පරාර්ථය ගැන. දැන් මේ කාලයේ 'සමාජ සේවය' ආදී වචන තියෙන්නේ. මේවා පිළිබඳව අපි කවුරුත් කතා කළාට මොකද සමාජයේ තියෙන විශාලම පිළිලයක් තමයි ඊර්ෂ්‍යාව කියන එක. ඒකට විරුද්ධ ගුණය තමයි මෙතන මේ කියන මුදිතාව. අර මව්පියන් දරුවකු ඇති දැඩි කිරීම පිළිබඳව ඇතිකර ගන්න මුදිතාව. 'මුදිතාව' කියන වචනය පවා බොහෝ දෙනාට පැහැදිලි නැහැ. මුදිතාව කියල කියන්නේ අනුන්ගේ සැපත පිළිබඳව සතුට ඇතිකරගැනීම. එහෙම නැත්නම් අනුන් සැපතේ සිටිනවා දැකලා හරියට තමන් සැපතට පත්වුනා වගේ සිතින් සතුටු වන ගතිය. ඒ ගුණය බොහෝ දෙනා තුළ අඩුයි. ඒ නිසා සමහර විට පරාර්ථසේවය කියලා කරනවා නමුත් අර නූල් සූත්තර වගේ බලාපොරොත්තු වන්නේ ඒ පුද්ගලයා තමා යටතේ තබා ගැනීම. ඒ පුද්ගලයාට තනිව නැඟී සිටින්න දෙන්නේ නැහැ. ඊර්ෂ්‍යාවට හැරෙනවා. "අපෙන් කාල බීල හැදිච්ච කෙනා. මෙයාට කොහොමද මම සම ආසනය දෙන්නේ." ඔන්න ඔය ප්‍රශ්නය එනවා. සමානාත්මතා කතාවත් ඒ එක්කමයි යන්නේ. ඊර්ෂ්‍යාව ඇතිතාක්, ඒ කියන දුර්ගුණය ඇතිතාක්, අර කියාපු පරහිත සංකල්පය සම්පූර්ණ වන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම අර උපදේශකයෙකුට තියෙන්න ඕන මුදිතාව. ඔන්න එතකොට අපට පෙනෙනවා අර සතර බ්‍රහ්ම විහරණයත් මෙන්න මේ කියාපු සංග්‍රහ බලයත්, සංග්‍රහ වස්තූන් පිළිබඳ අවබෝධය වගේම ඒ ක්‍රියාත්මක වීමත්. ඒකට යටින් තිබෙන්නේ අර සිත පිළිබඳ කාරණයයි. දැන් අපි සතර බ්‍රහ්ම විහරණ ගැන කියන කොට බොහෝ විට දක්වූවා මේවා පවුලේ මට්ටමින්. දැන් අපි පවුල කියන්නෙ සමාජයේ ඒකකයක්. ඒක නිසා තමයි බුදුරජාණන් වහන්සේ දක්වලා තියෙන්නෙ

**"මාතායථා නියං පුත්තං - ආයුසා එක පුත්ත මනුරක්ඛෙ**

**එවම්පි සබ්බ භූතෙසු - මානසම්භාවයෙ අපරිමාණං"**

ඒක උපමාවක් විතරයි. නිදර්ශනයක් පමණයි. යම්සේ මවක් තමාගේ දරුවකු තම ජීවිත පරිත්‍යාගයෙන් රැක ගන්නා වාගේ හැම සත්ත්වයා කෙරෙහිම **අපරිමාණ වශයෙන් අප්‍රමාණව** - අන්න එතකොට අපට හිතාගන්න පුළුවන් සමාජ සේවකයකු අර කියාපු සතර බ්‍රහ්ම විහරණයෙ මෛත්‍රිය අපරිමාණ වශයෙන් වඩනවා. දන් පවුලකට සීමා කරලා වඩන ගුණය මුළු මහත් සමාජයටම. මොකද, බුදුරජාණන් වහන්සේට නම් පෙනුනේ - අපි මේ කොටුකර ගන්නවා ජාති වශයෙන් ගෝත්‍ර වශයෙන් ඒ විධියට කොටුකර ගත්තට- බුදුරජාණන් වහන්සේගේ බුදු ඇසට පෙනුනේ හරියට මුහුදට ගසාගෙන යන පිරිසක් වගේ. මේ ඔක්කොම සංසාර සාගරයේ සත්ත්වයින්. එතකොට ඒ කොයි හැටි හෝ වේවා අර නුවණැති ආර්ය පුද්ගලයා කල්පනා කරනවා අර ඊර්ෂ්‍යාව ආදී දුර්ගුණ වලින් ඉවත් වෙලා හැමදෙනාගේම යහපත. ඒක තුළ තමාගේ ආධ්‍යාත්මික වැඩීමක් වෙනවා. ඒකයි 'අප්පමඤ්ඤ' කියලා උසස් ධ්‍යාන තත්ත්ව වශයෙන් දක්වලා තියෙන්නේ. ඉතින් ඒවා වචන පමණක් නොවෙයි. කෙනෙක් උත්සාහවත් වෙනවා නම් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

මෛත්‍රිය ගැන කවුරුත් අහලා තියනවා. මෛත්‍රී භාවනාව වඩන හැටිත් අපි බොහෝ අවස්ථාවල නා නා විධ ක්‍රම වලින් දක්වලා තියෙනවා මේ දේශනා ආදියෙදි. ඉතින් අර කෙටියෙන් තමන් සළකා ගත්තොත් හැම දෙනාම සැපයට කැමතියි. දුකට අකමැතියි කියන ඒ සංකල්පය හිතට ධාරණය කර ගත්තාට පස්සේ 'සුවපත් වේවා' වැනි වචනයකින් පටන් ගන්න භාවනාව යම් අවස්ථාවක එක පුද්ගලයකුට පමණක් සීමා කරලා නොවේ. ඒකට තමයි ධර්මයේ තියෙන්නේ 'දිසා ඵරණය' කියලා. 'අප්පමඤ්ඤ' කියල කියන අප්‍රමාණ තත්වයට සිත වැඩීමේදී මෛත්‍රී භාවනාවට ධර්මයේ දක්වෙන්නේ **'එකං දිසං, දුතියං දිසං, තතියං දිසං, චතුත්ථිං දිසං, උද්ධං අධො'** එක දිසාවක්, දෙවෙනි දිසාව, තුන්වැනි දිශාව, හතරවැනි දිසාව, ඉහළ පහළ, ආදී වශයෙන් මුළු මහත්

විශ්වයටම සීමාවක් නොමැතිවම අර 'සුවපත් වේවා' කියන හැඟීම විහිදුවා හැරීමයි. සමහර විට කියනව සීමා සම්භේද කියල කිසිම සීමාවක් නැතිව, වැට කඩුළු ඉවත් වෙන ආකාරයට. ඒ මෛත්‍රීය පිළිබඳව දක්වලා තියනව වගේම කරුණාව පිළිබඳවත් එහෙම කියල තියෙනවා අප්‍රමාණ තත්ත්වයට වඩන්න කියලා. මුදිතාව පිළිබඳවත් එහෙමයි. අර ඊර්ෂ්‍යාවට එතකොට ඉඩක් නැහැ. ඊර්ෂ්‍යාව කියල කියන එක සමාජ පිළිලයක්. පිළිලය කියන එක ගහක හට ගත්තොත් ගහ විනාසයි. ඒ වගේම තමයි මේ කවුරුත් දන්නවා හැම තැනම තරඟකාරිත්වය කියල එකක් තියනවා. ඇත්ත වශයෙන් දක්ෂතාව, නිපුනතාව, කුසලතාව, මැනීමට උපකරණයක් හැටියට උපයෝගිතාව ඇති දෙයක් හැටියට අප සළකනවා විභාග තරඟ ආදිය. ක්‍රීඩා තරඟ. දහම් පාසල් වල පවා තරඟ තියෙනවා. නමුත් මේ තුළින් ඉතාම සියුම් අන්දමින් ඇතිවෙන අර ඊර්ෂ්‍යාව ආදී දේවලින් පරිස්සම් වෙන්න ඕනෑ. පරිස්සම් වෙන්නෙ අන්න අර මුදිතා ආදී ගුණයෙනුයි. එතකොට අපිට තරඟ නැතිව බැරිව වගේ පෙනෙනවා, අර **කුසලතාව** මැනීම සඳහා. **නමුත් කුසලයාට ලැබෙන්නේ තෑග්ග නොවේ. ප්‍රශංසාව නොවේ. තමන් එක්ක තරඟ කළ අයගේ ද්වේශය, ඊර්ෂ්‍යාව.** ඒ නිසාම සමහර විට අකාල මරණය.

මේ පින්වතුන් හොඳින් දන්නවා ඒක පාසල් මට්ටමට ඇවිල්ලා. රැකියා මට්ටමේ තිබුන එක. අනිත් ඒවා ගැන අපි කියන්න ඕනෙ නැහැ. ඊට ඉහළ මට්ටම් ගැන. රැකියා ආදී දේවල සමාජයෙ විවිධ තරාතිරම් වල තිබුන එක අධ්‍යාපන ක්ෂේත්‍රයටත් ඇවිල්ලා. වැඩියෙන් ලකුණු ගත්තු කෙනා සමහර විට තමන්ගෙම හිතවතුන්ගෙන් මරණයට පත්වෙනවා. ඒ විධියේ තත්ත්වයක්. මොකද තරඟකාරිත්වය අවශ්‍යතාවක් වුනත් ලෝකයේ දක්ෂතාව උරගා බැලීමට, ඒ තරඟය තුළ අර ඒ දිනූ කෙනා අලුත් ඉලක්කයක් ලෝකයට දුන් හැටියට, අලුත් වාර්තාවක් පිහිටවූ කෙනෙක් හැටියට, සළකලා ප්‍රශංසා කරන්න තෑග්ගක් දෙන්න නැමෙනවා වෙනුවට,

ඒ මුදිතා ගුණය වෙනුවට, ලෝකයා තුළ තිබෙන්නේ එයා වට්ටලා, එයා නැති කරලා විනාශ කරලා, එතෙන්ට පැමිණෙන එකයි.

අන්න එතකොට අපි කල්පනා කරන්න ඕන ඔය විධියට බුදුරජාණන් වහන්සේ දක්වූ පරහිත සංකල්පය. මේවා උපකාර වෙනවා ඇත්ත වශයෙන් මේ කාලයේ **උපදේශකයින්ට. උපදේශනය කියල කියන්නේ ඒකත් වවාගෙන කන රස්සාවක් නොවෙයි.** අන්න අර කියාපු ඇතුළත තියන කුසල් ශක්තිය ඉදිරිපත් කරගෙන ඒ එක්කම තමාගේ ආධ්‍යාත්මික දියුණුවට උපකාර වෙන අන්දමටයි. හැම දෙයක්ම, හැම ‍රැකියාවක්ම, මුදලට යටවන යුගයක **උපදේශනයත්** ‍රැකියාවක් කරගෙන සමහරු ඒක තුළ අර නියම ආකල්පය ඇති කරගන්නෙ නැහැ. අන්ධයෙක් කොහොමද කෙනෙකුට පාර දක්වන්නේ.

දැන් මේ පින්වතුන් අහල තියනවා බුදුරජාණන් වහන්සේ ලෝකය ගැන කථා කරන තැන අන්ධයා, එකැස් කණා, ඇස්දෙකම පෙනෙන කෙනා කියලා ඔය විධියට දක්වලා තියනවා. අන්ධො, එක චක්ඛු, ද්වි චක්ඛු. අන්ධයා කියන්නෙ, මෙලොව යහපත ගැන අවබෝධයකුත් නැහැ. පරලොව යහපත ගැන අවබෝධයකුත් නැහැ. තමාගේ යහපත දන්නෙත් නැහැ අනුන්ගෙ යහපත දන්නෙත් නැහැ. ඒ විධියට. නමුත් එකැස් කණා මෙලොව යහපත ගැන පමණක් අදූරදර්ශීව කෙටිකාලීන සැලසුම් වලින් තමාගේ ආර්ථික දියුණුව, අනියම් මාර්ග වලින් හරි ඇතිකර ගන්නවා. **එකැස් කණාගේ වපර දෘෂ්ටියෙන් කෙනෙකුට පිහිටවෙන්න බැහැ.** මෙලොව පරලොව දෙකම පිළිබඳව හොඳ නරක වටහා ගත්තු බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා මේ සංසාර ගමන ගැන හිතලා බලනකොට කවුරුත් නොයෙකුත් විධියේ විවිධ කුලවල, ජාතිවල ඒ ඒ තැන්වල උපන්නත් මේ එකම සංසාර ගමනේ යෙදෙන්නේ. ඇතැම් විට සංසාරයේ ඔවුනොවුන්ට නෑයින් වෙලා සහෝදරයින් වෙලා එකට හිටපු කට්ටිය. ඒ විධියේ අවබෝධයක් ගත්තා නම් ඒ තැනැත්තාට තේරෙනවා මේ එක්කෙනෙක් වට්ටලා

ඒ තැනට ඒම වැනි දේවල් තමාගේ පරිහානියට හේතුවන බව. අන්ධයාට කොහොමත් බැහැ. **එකැස් කණාගේ වපර දෘෂ්ටිය අරගෙනත් බැහැ කෙනෙකුට උපදේශනයක් කරන්න.** ඒ අනුව අපි හරියාකාරව දෙපක්ෂයේම දෙලොවටම යහපත සැලසෙන - දෙලොව පමණක් නොවේ නිවනත් සැලසෙන හැටියටයි දන් මෙතන මේ සතර සංග්‍රහ වස්තු බුදුරජාණන් වහන්සේ විග්‍රහ කරලා තියෙන්නේ. මෙලොව දියුණුවත්, පරලොව දියුණුවත්, අවසානයේ නිවනත් සැලසෙන ආකාරයට. අර සංග්‍රහ බල කියන තැනින් අපට මාර්ග ඵල අනුව සමානාත්මතාව දක්වල තියෙන්නෙ ලෝකෝත්තර පැත්තෙන්.

ඒ අනුව අපි කල්පනා කරන්න ඕන එතකොට මේ සතර සංග්‍රහ වස්තු කියන්නෙ මේ ශාසනයේ ඉතාමත්ම වටිනා ධර්මයක් බව. බොහෝ දෙනා ඇතැම් විට අපේ මේ දේශනා ගැන උදාසීන වෙනවාත් ඇති හැමදාම නිවන ගැන කියනවා කියලා. නමුත් ඔන්න නිවනට මඟ තියෙන්නෙත් මේ කියාපු ක්‍රියා මාර්ග තුළින් බව අපි තේරුම් ගන්න ඕනෑ. මේක වෙන් කරන්න බැහැ ධර්මයෙන්. එතකොට මේ සතර සංග්‍රහ වස්තු, සතර බ්‍රහ්මවිහරණ, තම තමන්ගේ ආධ්‍යාත්මික දියුණුවට වගේම සමාජයේ දියුණුවටත් හේතුවෙනවා. **සමාජය කියලා කියන්නේ පුද්ගලයාගෙන් වෙන්වූ දෙයක් නොවේ. පවුල කියලා කියන්නෙ අර ජාතියෙන්- සමාජයෙන් වෙන්කර ගත්තු දෙයක් නොවේ. ඒකකයක් හැටියට සැළකුවාට කමක් නැහැ. ඉතින් මෙතන තියන අඩුපාඩුවම තමා සමාජයට බලපාන්නේ. මෙතන තියන දියුණුවම තමා සමාජයට බලපාන්නේ.** ඉතින් අපි පුද්ගලයින් වශයෙන් මව්පියන්ගෙන් ඉගෙන ගත්තු සතර බ්‍රහ්ම විහරණ, මව්පියන් ඇසුරෙන් හඳුනාගත්තු ඒ සතර සංග්‍රහ වස්තු, අපි අපගේ ජීවිත වලට ළං කරගෙන අන්න අර කියාපු **උපදේශනය** අනික් අයට දෙන්න කලින් තමන් සංග්‍රහ බලයෙන් ශක්තිමත් වුනොත් අන්න එතකොට ඇත්ත වශයෙන්ම තමන්ට පුළුවන් මඩගොඩින් නැගිටලා

අනික් අයත් ඒ තත්ත්වයෙන් නැගිටුවගන්න.

අපි කල්පනා කරන්න ඕන, බුදුරජාණන් වහන්සේ මේ ධර්මය දේශනා කළේ එක දවසින්ම නිවන් දක්වන්ට නොවේ. විවිධ තරාතිරම් වලයි ඒ ඒ අය ඉන්නෙ. ඒකයි බුදුරජාණන් වහන්සේ දාන කථාවෙන් ආරම්භ කළෙ. දානකථාවෙන් ආරම්භ කරල අනුපිළිවෙල කථාව කියන්නේ. දාන කථා, සීල කථා, සග්ග කථා. දානයේ වටිනාකම වෙන එකක් කරන්න බැරි කෙනාට ඒකවත් කරන්න කියලා. සීලයක් රකින කියලා. දන් දෙනකොටවත් ඒ සීලය රැකගන්න කියලා. ඊළඟට ඒවායේ, දානයේ සීලයේ, ආනිසංස දක්වලා 'සග්ග කථා'. ඊළඟට කාමයන්ගේ ආදීනව. ක්‍රම ක්‍රමයෙන් කුඩා දරුවන් සෙල්ලම් බඩු වලින් ඉවත් කරලා ඉහළට ගන්නවා වගේ ලෝකයා ඒ කියාපු ලෞකික මට්ටමින් ඉහළට අරගෙන චතුරාර්ය සත්‍යය දක්වලා බුදුරජාණන් වහන්සේ නිවන් කරා ගෙන ගියා.

අන්න ඒ වගේ අපිත් කල්පනා කරන්න ඕන මේ අවුරුද්ද ආරම්භයේදි මෙන්න මේ කියාපු සතර සංග්‍රහ වස්තු වලින් පටන් ගන්න ගමන, සතර බ්‍රහ්ම විහරණ වලින් පටන් ගන්න ගමන, යම් අවස්ථාවක නිවන් දක්වා ගෙන යාමට මේ දේශනාවත් හේතුවේවා කියල. මේ දේශනා ශ්‍රවණයේ ආනිශංස මේ පින්වතුන්ටත් උපකාර වෙනවා නම් තමන්ගේ බණ භාවනාදියට, සිත සමාධිමත් කර ගැනීමට, ඒ කුසල ශක්තීන් උපකාර කරගෙන මේ ජීවිතයේදීම උත්සාහවත් වෙලා කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් බණ භාවනා සාර්ථක කරගෙන සෝවාන්, සකදාගාමී, අනාගාමී, අර්හත් කියන මාර්ගඵල ප්‍රතිවේධයෙන් උතුම් අමාමහ නිවන් සාක්ෂාත් කර ගැනීමට මේ ධර්ම දේශනාව උපකාරවත් වේවා! කියල ප්‍රාර්ථනා කර ගන්න අතරම ධර්ම ශ්‍රවණ ආනිශංසත් ධර්ම දේශනයේ ආනිශංසත් අනුමෝදන් වීමට බලාපොරොත්තු වන විශ්වයේ යම්තාක් සත්ත්වයින් සිටිනවා නම් අවීචියේ සිට අකනිටාව දක්වා ඒ හැම කෙනෙක්ම

අනුමෝදන්වීම තුළින් තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා! කියල ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

**"එත්තාවතාච අම්හෙහි ...."**

# 05

# ගැටපද විවරණය

පිටු අංකය

1. තත්කාලීන - ඒ කාලයට අයත්

   ආචාර ධර්මෝද්දීපනය වන අයුරින් - ශීලාදී ගුණධර්ම ප්‍රකටවන ලෙස

   කේවල සනාතන බ්‍රහ්මයකු - එකම සදාකාලික බ්‍රහ්මයකු

   බ්‍රහ්ම සහව්‍යතාව - බ්‍රහ්මයා හා එක්වීම

   ඍජු නෛර්යාණික මාර්ගය - කෙළින්ම ඉලක්කය කරා ගෙනයන මග

2. ඥාන පරිපාකයක් - නුවණ මේරීමක්

   ආසක්තභවක් - ඇලීමක්

   මමායනයක් - මගේයයි කීමක්

3. කරුණාධ්‍යාසය - කාරුණික අදහස

   දයා ක්ෂමා දාක්ෂිණ්‍යාදී - දයාව සමාව දීම, පරිත්‍යාග ගුණයආදිය.

4. උචිතානුචිත විවේක බුද්ධිය - සුදුසු නුසුදුසු බව තෝරාගන්නා නුවණ

   ඊර්ෂ්‍යා පරවශ අසහනයක් - ඊර්ෂ්‍යාවට ගැතිවූ නොඉවසන බවක්

   මමත්වයෙන් නිපන් - 'මගේ' යන හැඟීමෙන් හටගත්.

5. පරිසමාප්ත - සම්පූර්ණ

   ප්‍රහර්ෂාත්මක - දැඩි සතුට සහිත

6. මේ නයින් බලන කල - මේ ආකාරයෙන් බලන විට

   පරමාර්ථ සත්‍යාන්වේෂණයෙහිලා - පරමාර්ථ සත්‍යය සෙවීම පිළිබඳව

   කර්මණ්‍යවූ - ක්‍රියාකාරී වූ

   ප්‍රවෘත්ති ධර්මතාව - පැවැත්ම පිළිබඳ නීතිය.

7. උපන්‍යාස - සිතා ගැනීම් වශයෙන් ඉදිරිපත් කරන මත
ප්‍රත්‍යනීක - එකිනෙකට විරුද්ධ
තිරශ්චීන සමාජයෙහි - තිරිසන් සමාජයෙහි
ඖළාරික - රළු, ගොරහැඩි
සමූලඝාතනය - මුළුමනින්ම විනාශකිරීම
අන්‍යෝන්‍යානුග්‍රාහක - ඔවුනොවුන්ට පිහිටවන අන්දමේ
දාරකස්නේහය - දරු සෙනෙහස

8. තත් සම්බන්ධතාව - ඒ සම්බන්ධතාව
චතුසසත්‍ය පර්යාපන්න - චතුරාර්‍යසත්‍යයට ඇතුළත්
කල්පිත සම්මුතියක් - සිතින් හදාගත් සම්මතයක්
ආචාර විද්‍යාත්මක - ශීලාදි ගුණධර්ම පිළිබඳ

9. ප්‍රත්‍යන්ත - පිටිසර, දේශසීමා අසළ
ඔවුනොවුන් පරයා - එකිනෙකා පරදවා
සදය ආකල්පයකට - දයාන්විත බැල්මකට
සුඛනම්‍ය වර්ගීකරණයකට - පහසුවෙන් වෙනස්කළ හැකි වර්ගකිරීමකට

10. උද්යෝග ශක්තියෙන් - උත්සාහයේ බලයෙන්
ප්‍රගතිශීලිත්වයට - පෙරට යාමේ ගතියට
ප්‍රතිගාමිත්වයට - පසුබැසීමේ ගතියට
ඉඳුරා දෙවැදෑරුම් වූ - කෙළින්ම දෙයාකාරවූ
විභජ්‍යවාදීව - බෙදා දක්වන දර්ශනයට අනුව

11. ඡවි වර්ණය - පිට හමේ පාට
නිර්දිෂ්ට - දක්වන ලද
සමාජ ප්‍රස්තර සතර - සමාජ මට්ටම් සතර

| | | |
|---|---|---|
| | ආවේණික | - විශේෂ වශයෙන් බැඳී පවතින. |
| | නෛසර්ගික | - උපතින්ම ලත්, ස්වාභාවික |
| | ආගන්තුක උපක්ලේශ | - පිටතින් පැමිණි කෙලෙස් |
| | චතුර් වර්ණයට | - කුල සතරට |
| | ප්‍රභවය | - හට ගන්නා තැන. |
| 12. | තත්පරවූවෝ | - එහිම ඇලුනෝ |
| | සත්තාවක් | - ඇති දෙයක් |
| 13. | අනුගුණව | - එකඟව |
| | මෙරමාගේත් | - අනුන්ගේත් |
| | ජටා විජටනයට | - ගැට ලිහීමට |
| | ආතමාර්ථකාමිත්වය මතුනොව | - ආත්මාර්ථකාමිත්වය පමණක් නොව |
| | පරහිතාධ්‍යාසය | - අනුන්ගේ යහපත පිළිබඳ අදහස |
| | අවැඩක්ම | - අයහපතක්ම |
| 14. | භාවික ආවේගයනට | - හැඟීම් තුළින් එන වේගවලට |
| | අයෝනිසෝ මනසිකාරයෙන් | - වැරදි ආකාරයට මෙනෙහි කිරීමෙන් |
| | ආප්ත වාක්‍යයකි | - ප්‍රස්තාව පිරුළකි. |
| 15. | නිර්වචනය | - හැඳින්වීම |
| | එකැතින්ම | - ඒකාන්තයෙන්ම |
| | ප්‍රතිභාග | - සමාන, එකිනෙකට ගැලපෙන |
| | මොනවට පිළිබිඹුවේ | - මැනවින් පෙන්නුම් කැරෙයි. |
| 16. | සිවු සඟරාවත් | - සතර සංග්‍රහ වස්තු |
| | ක්‍රමික ඓන්ද්‍රිය සංවර්ධනයකට | - ඉන්ද්‍රියයන්ගේ මෙන් ක්‍රමානුකූල වැඩීමකට. |
| | පරම නිෂ්ඨාව | - ඉහළම කෙළවර |
| | පුෂ්පෝද්භවයට | - මල් හටගැනීමට |

ඊශ්වර ප්‍රභූතවූ - ඊශ්වරයාගෙන් හටගත්තා වූ

සන්තානගත පරිවර්තනයකට - සිත පිළිබඳ පෙරළියකට

17. සුඛාන්වේෂණය - සැපසෙවීම

ප්‍රවණතාව - නැඹුරුව

18. ඓහලෞකික පාරලෞකික - මෙලොව හා පරලොව පිළිබඳ

සුකර ක්‍රියාමාර්ගී - පහසු ක්‍රියා මාර්ගී

හ්‍රස්ව දෘෂ්ටි - දුර නොදක්නා දෘෂ්ටි, කෙටි දෘෂ්ටි

දූ කෙළිය - සූදු ක්‍රීඩාව

අපිස් - අල්පේච්ඡ, ආසා අඩු

ධනෝපායන ව්‍යාපාර - ධනය ඉපයීමේ ව්‍යාපාර

19. ඈ විසින් - ආදි වශයෙන්

වඩා ප්‍රශස්ත - වඩා හොඳ, වඩා පැසසිය යුතු

ස්වයං ජාත හැල් - ඉබේ හටගත් හැල් වී

20. බහුභාණ්ඩිකවයෙන් තොරව - බොහෝ බඩු පරිහරණයෙන් වෙන්ව.

සංකේන්ද්‍රීය පාලනක්‍රමය - එකම මධ්‍යස්ථානයකින් පාලනය කිරීම.

සාම්‍රාජ්‍යය - මුළු පොළොව පාලනය කරන රජය

21. පෙරළා - ආපසු

සක්විති වත් - චක්‍රවර්ති යුතුකම්

උත්තේජකයක් - උනන්දු කරවන දෙයක්

දිග් විජයක් - දිශා ජය ගැනීමක්

22. භූත දයාව - සත්ත්ව කරුණාව

පසමිතුරන් - සතුරන්

# කතු හිමියන්ගේ සිංහල කෘති

| | |
|---|---|
| *1. උත්තරීතර හුදෙකලාව - (මුල් මුද්‍රණය) දම්සක් අංක 172/173 - | (1990) |
| -එම- (නව මුද්‍රණය), ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය | (2001) |
| 2. පින් රුකෙක මහිම | (1988) |
| 3. විදසුන් උපදෙස් | (1997) |
| 4. නිවනේ නිවීම - පළමු වෙළුම | (1997) |
| 5. නිවනේ නිවීම - දෙවන වෙළුම | (1998) |
| 6. නිවනේ නිවීම - තෙවන වෙළුම | (1998) |
| 7. නිවනේ නිවීම - සිවුවන වෙළුම | (1998) |
| 8. නිවනේ නිවීම - පස්වන වෙළුම | (1999) |
| 9. නිවනේ නිවීම - සයවන වෙළුම | (1999) |
| 10. නිවනේ නිවීම - සත්වන වෙළුම | (1999) |
| 11. නිවනේ නිවීම - අටවන වෙළුම | (2000) |
| 12. නිවනේ නිවීම - නවවන වෙළුම | (2001) |
| 13. නිවනේ නිවීම - දසවන වෙළුම | (2002) |
| 14. නිවනේ නිවීම - එකොළොස්වන වෙළුම | (2004) |
| 15. නිවනේ නිවීම - පුස්තකාල මුද්‍රණය - ප්‍රථම භාගය - (1-6 වෙළුම්) | (2000) |
| 16. නිවනේ නිවීම - පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්) | (2010) |
| 17. පහන් කණුව ධර්ම දේශනා - 1- වෙළුම | (1999) |
| 18. පහන් කණුව ධර්ම දේශනා - 2- වෙළුම | (2000) |
| 19. පහන් කණුව ධර්ම දේශනා - 3- වෙළුම | (2001) |
| 20. පහන් කණුව ධර්ම දේශනා - 4- වෙළුම | (2003) |
| 21. පහන් කණුව ධර්ම දේශනා - 5- වෙළුම | (2005) |
| 22. පහන් කණුව ධර්ම දේශනා - 6- වෙළුම | (2006) |
| 23. පහන් කණුව ධර්ම දේශනා - 7- වෙළුම | (2009) |
| 24. පහන් කණුව ධර්ම දේශනා - 8- වෙළුම | (2012) |
| 25. හිතක මහිම - 1 | (1999) |
| 26. හිතක මහිම - 2 | (2003) |
| 27. හිතක මහිම - 3 | (2012) |
| 28. හිත තැනීම | (2000) |
| 29. පැවැත්ම හා නැවැත්ම | (2000) |
| 30. ඇති හැටි දැක්ම | (2001) |
| 31. දිවි කතරේ සැඳෑ අඳුර | (2001) |
| 32. කය අනුව ගිය සිහිය | (2001) |
| 33. මා-පිය උවැටන | (2002) |
| 34. ප්‍රතිපත්ති පූජාව | (2003) |
| 35. චලන චිත්‍රය | (2004) |
| 36. දිය සුළිය | (2005) |
| 37. අභිනික්මන | (2003) |
| 38. බුදු සමය පුද්ගලයා හා සමාජය | (2009) |
| 39. මනසේ මායාව | (2010) |
| 40. භාවනා මාර්ගය | (2011) |
| 41. සසුන් පිළිවෙත | (2011) |
| 42. පිළිවෙතින් පිළිවෙතට | (2011) |
| 43. තිසරණ මහිම | (2012) |
| 44. කයේ කතාව | (2012) |
| 45. මෙත් සිතේ විමුක්තිය | (2012) |
| 46. පටිච්ච සමුප්පාද ධර්මය - 1 වෙළුම | (2012) |
| 47. පටිච්ච සමුප්පාද ධර්මය - 2 වෙළුම | (2014) |
| 48. පටිච්ච සමුප්පාද ධර්මය - 3 වෙළුම | (2014) |
| 49. පටිච්ච සමුප්පාද ධර්මය - 4 වෙළුම | (2014) |
| 50. සක්මනේ නිවන | (2012) |
| 51. තපෝ ගුණමහිම | (2013) |
| 52. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට | (2013) |

* බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර.

# කතු හිමියන්ගේ ඉංග්‍රීසි කෘති

| | | | |
|---|---|---|---|
| * | 1. | Concept and Reality in Early Buddhist Thought | (1971) |
| | | - do - D. G. M. B. Edition | (2012) |
| * | 2. | Samyutta Nikaya - An Anthology, Part II - Wheel No, 183/185 - | (1972) |
| | | - do - D. G. M. B. Edition | (2009) |
| * | 3. | Ideal Solitude - Wheel No, 188 - | (1973) |
| * | 4. | The Magic of the Mind - | (1974) |
| | | - do - D. G. M. B. Edition | (2007) |
| | 5. | Towards Calm and Insight - | (1991) |
| | | - do - D. G. M. B. Edition | (1998) |
| | 6. | From Topsy - turvydom to Wisdom - Volume 1 - | (2003) |
| | 7. | From Topsy - turvydom to Wisdom - Volume II - | (2012) |
| | 8. | Seeing Through | (1999) |
| | 9. | Towards A Better World | (2000) |
| | 10. | Nibbana - The Mind Stilled - Volume I - | (2003) |
| | 11. | Nibbana - The Mind Stilled - Volume II - | (2005) |
| | 12. | Nibbana - The Mind Stilled - Volume III - | (2005) |
| | 13. | Nibbana - The Mind Stilled - Volume IV - | (2006) |
| | 14. | Nibbana - The Mind Stilled - Volume V - | (2007) |
| | 15. | Nibbana - The Mind Stilled - Volume VI - | (2010) |
| | 16. | Nibbana - The Mind Stilled - Volume VII - | (2012) |
| | 17. | Nibbana - The Mind Stilled - Library Edition - | (2015) |
| | 18. | Nibbana and The Fire Simile | (2010) |
| | 19. | 'A Majestic Tree of Merit' | (2012) |
| | 20. | The End of the World in Buddhist Perspective | (2014) |

* Buddhist Publication Society, P.O. Box, 61, Kandy
බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය, තැ.පෙ. 61, මහනුවර

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්
**අනුර රූපසිංහ මහතා**
අංක: 27, කොළඹ වීදිය, මහනුවර.
දුරකථනය: 081-2232376